# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# ANNUAL REPORT
# 2018




## දේශීය වෛද්‍ය විද්‍යායතනය
## உண்ணாட்டு மருத்துவக் கல்வி நிறுவகம்
## INSTITUTE OF INDIGENOUS MEDICINE

## කොළඹ විශ්වවිද්‍යාලය
## கொழும்பு பல்கலைக்கழகம்
## UNIVERSITY OF COLOMBO

# දැක්ම

ආයුර්වේද, යුනානි සහ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම පිළිබඳ
ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් පිළිගත්
ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම
මධ්‍යස්ථානය බවට පත් වීම.

# මෙහෙවර

ශ්‍රී ලංකාවේ ආයුර්වේද, යුනානි සහ සාම්ප්‍රදායික
වෛද්‍ය ක්‍රමවල උන්නතිය සඳහා
අවශ්‍ය දැනුම බෙදා හැරීම සඳහා වන
ඉගැන්වීම් සහ පර්යේෂණ
සිදු කිරීම

# අධ්‍යක්ෂතුමියගේ පණිවුඩය




මා 2018 වසර සඳහා අපගේ කාර්ය සාධනය සහ ජයග්‍රහණ වාර්තා කරන්නේ ප්‍රීතියෙනි. පසුගිය වසර ආයතනය සඳහා පරිවර්තනාත්මක සහ ධනාත්මක සංවර්ධනයකින් යුතු වසරක් විය. ආයතනය එහි මෙහෙයුම් පිළිගත් අධ්‍යයන / පරිපාලන / අනධ්‍යයන / ශිෂ්‍ය ව්‍යුහ හරහා සමාලෝචනය කළ අතර ඒ සියල්ල අපගේ ඉගැන්වීම් සහ පර්යේෂණ හැකියා තවදුරටත් වැඩි දියුණු කරමින්, විශිෂ්ටත්වය ලබා ගැනීම ඉලක්ක කර තිබුණි.

එයට නව දැක්මක් තිබුණු අතර අපට පසුගිය වසරේදී පොරොන්දු වූ බොහෝ ඉලක්ක ළඟා කර ගත හැකි විය. අපගේ වඩාත්ම වැදගත් ඉලක්කවලින් එකක් වූයේ විද්‍යායතනයේ කාර්යසාධනය යළි සක්‍රිය කොට රට තුළ දේශීය වෛද්‍ය ක්‍රමයේ ප්‍රමුඛයා බවට පත්වීමය.

විද්‍යායතනය එහි දැක්ම අනුව අඛණ්ඩව ක්‍රියා කළ අතර ළඟා කර ගත් ජයග්‍රහණ ගැන සාඩම්බර වෙයි. වසර අවසානය වන විට විද්‍යායතනය සාර්ථකව ඉලක්ක ව්‍යාපෘති සම්පූර්ණ කර තිබිණි. අපි දැන් ඉගැන්වීම පිළිබඳ අපගේ නව ව්‍යුහය ක්‍රියාත්මක කරන අතර මහත් උද්‍යෝගයකින් සහ සුබවාදී බවකින් අනාගතය දෙස බලා සිටිමු. ඉදිරි වසර තුළ අපගේ අවධානය යොමු වන්නේ විෂයමාලා සහ යටිතල පහසුකම් සංවර්ධනය හරහා හොඳම දේශීය වෛද්‍යවරුන් බිහි කිරීමට අපගේ නව අධ්‍යාපන උපාය මාර්ග මූලාරම්භ කිරීම පිළිබඳවය. නව විෂයමාලාව හඳුන්වා දීම සහ තිබෙන විෂයමාලාව සංවර්ධනය කිරීම සඳහා 2018 වසර පුරා විෂයමාලා සංවර්ධන කමිටුවෙහි අප්‍රතිහත උත්සාහයට මම මාගේ ස්තුතිය පළ කිරීමට කැමැත්තෙමි. මම පසුගිය වසරේ අපගේ සම්ප්‍රදායන් සහ සුවිශේෂී ජයග්‍රහණ ශක්තිමත් කිරීමට සහ අපගේ කැපවීමෙන් යුත් කාර්ය මණ්ඩලයට සහ කුසලතා පූර්ණ සිසුන්ට සිය හැකියාවෙහි උපරිමය කරා ළඟා වීමට සුරැකුම සහ සහාය අඛණ්ඩව ලබා දීමට අපේක්ෂා කරමි.

2018 වරස තුළදී සිදු කළ වැඩවල ප්‍රගතිය පහත පරිදිය.

2019-2020 සඳහා උපායමාර්ගික සැලසුම සංවර්ධනය කිරීම විශාල ජයග්‍රහණයක් වූයේ එහි ආයතනයේ අරමුණු අර්ථ නිරූපණය කොට ප්‍රමුඛතා නිශ්චිත වැඩ සැලසුම්වලට හඳුනා ගන්නා බැවිනි. උපායමාර්ගික සැලසුමේ අරමුණුවලට දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යාපනයට ඇති ඉල්ලුම වැඩි කිරීම, අධ්‍යයන වැඩසටහන්වල ගුණත්වය වැඩි කිරීම, පර්යේෂණ, නවෝත්පාදන සහ ව්‍යවසායකත්වය ශක්තිමත් කිරීම, සමාජ-ආර්ථික සංවර්ධනය කෙරෙහි IIM හි දායකත්වය, ජාත්‍යන්තර ආයතන සමග අන්තර්ක්‍රියාකාරිත්වය වැඩි කිරීම, IIM හි භෞතික සහ සෞන්දර්යාත්මක පරිසරය සහ පාර්ශ්වකරුවන්ගේ තෘප්තිය වැඩි දියුණු කිරීම, මූල්‍ය කළමනාකරණය සහ තිරසාර භාවය සහතික කිරීම සහ IIM හි ගුණත්වය සහ ධාරිතාව වැඩි දියුණු කිරීම ඇතුළත්‍ය. 2018 වසර සඳහා ක්‍රියාකාරී සැලසුම පිළියෙළ කරන ලද අතර කාර්යසටහන් කරන ලද සැලසුම් නිසි පරිදි ක්‍රියාත්මක වන්නේද යන්න සහතික කර ගැනීමට ක්‍රියාකාරී සැලසුමෙහි කාර්තුමය ඇගයීම සිදු කරන ලදී.

2018 ක්‍රියාකාරී සැලසුමේ විශේෂ සිදුවීම් අතර පහත දේවල් වේ.

විද්‍යායතනයේ වර්තමාන තත්ත්වයට ගැලපෙන ලෙස නියමාවලිය සංශෝධනය කරන ලද අතර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටි පරිදි 2017/2018 ශිෂ්‍ය කණ්ඩායම සඳහා නව විෂය නිර්දේශය කරන ලදී. BAM සහ BUMS උපාධි වැඩසටහන්වල තත්ත්වය පවත්වා ගැනීමට තිබෙන විෂය නිර්දේශයද සංශෝධනය කරන ලදී. විශ්වවිද්‍යාලය ක්‍රියා කළ යුතු ක්ෂේත්‍රවලින් එකක් වන්නේ විද්‍යායතනයෙහි ප්‍රධාන සැලසුමය. අරමුදල් ඉල්ලීම සඳහා ගොඩනැගිලි දෙකක යෝජනා පිළියෙළ කර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදී. විද්‍යායතනයෙහි පවතින ඉඩකඩ අවහිරතා වළක්වා ගැනීමට අපි මෙය ප්‍රමුඛතාවක් ලෙස සලකමු.

තවද, ආයුර්වේද සම්බාහන චිකිත්සාව සහ ඖෂධීය ඖෂධ නිෂ්පාදනය පිළිබඳ කෙටිකාලීන පාඨමාලා ආරම්භ කර ඇති බව සඳහන් කිරීමට මා කැමතියි. වාරය තුළදී අනුරාධපුර, කතරගම, සහ දෙවුන්දර ප්‍රදේශවල ජංගම සායන පවත්වන ලදී.

අපට තවම දිගු දුරක් ගමන් කිරීමට තිබෙන අතර, මෙම වාර්තාව විද්‍යායතනය යහපත් ප්‍රගතියක් ලබා ගන්නා බව ප්‍රදර්ශනය කරන බව මම අපේක්ෂා කරමි. මම සියල්ලටම පළමුව විද්‍යායතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයට මගේ නායකත්වය කෙරෙහි යහපත් ප්‍රතිචාර දැක්වීම, ඔවුන් විසින්ම මූලාරම්භයන් රැසක් සිදු කිරීම සහ අරමුණු සහ නියමිත කාල තුළ කටයුතු ඉටු කිරීම ගැන ස්තුතිය පළ කිරීමට කැමතියි. මම විශේෂයෙන්ම ආයුර්වේද සහ යුනානි අංශවල හිටපු සහ වර්තමාන ප්‍රධානීන්ට ඔවුන් විද්‍යායතනයට සහ මට ලබා දුන් දැඩි සහයෝගය වෙනුවෙන් ස්තුතිය පළ කරමි.

අපගේ සාර්ථකත්වය යනු දේශීය වෛද්‍ය ක්‍රමයේ සාර්ථකත්වයයි. අපගේ කළමනාකරණ මණ්ඩලය, අධ්‍යයන, පරිපාලන, අනධ්‍යයන කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයන්ගේ අඛණ්ඩ සහාය සමගින්, විද්‍යායතනය ඉදිරි 2019 වසර තුළ අභියෝග සහ ජයග්‍රහණ සඳහා සූදානම්ය.

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පී.ඒ. පරණගම**
**අධ්‍යක්ෂ**
**07.05.2019**

අන්තර්ගතය පිටු අංකය


| | | | |
|---|---|---|---|
| **01.** | ආයතනයේ අධිකාරීන් | | |
| | 1:1දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ හැඳින්වීම | | **01-04** |
| | **1:2** | ආඥාපනත | **05** |
| | **1.3** | කළමනාකරණ මණ්ඩලය | **06-07** |
| | **1.4** | අධ්‍යක්ෂක | **08** |
| | **1.5** | අධ්‍යයන කමිටු | **08** |
| | | **1.5.1** ආයුර්වේද අංශීය කමිටුව | **08** |
| | | **1.5.2** යුනානි අංශීය කමිටුව | **09** |
| **02.** | අධ්‍යයන අංශ, දෙපාර්තමේන්තු, ශාඛා, මධ්‍යස්ථාන සහ ඒකක | | **09** |
| | **2.1** | ආයුර්වේද දෙපාර්තමේන්තු යටතේ ඇති අංශ | **09** |
| | **2.2** | යුනානි දෙපාර්තමේන්තු යටතේ ඇති අංශ**09** | **09** |
| | **2.3** | තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සහ ඉංග්‍රීසි ඒකකය | |
| | **09** | | |
| | **2.4** | පුස්තකාලය | **10** |
| | **2.5** | පරිපාලන අංශ | **11** |
| **03.** | දේශීය වෛද්‍ය විද්‍යායතනය පිළිබඳ දළ විශ්ලේෂණයක් | | **11** |
| | **3.1** | රැස්වීම් සහ කමිටු | **11** |
| | **3.2** | පත්වීම් සහ කාර්ය මණ්ඩල තොරතුරු | **12** |
| | **3.3** | කාර්ය මණ්ඩල වෙනස් වීම් **2018** | **12** |
| | **3.4** | කාර්ය මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව | **13** |
| | **3.5** | පරිපාලන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර | **13** |
| | **3.6** | ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර **– 2018** | **14** |
| | **3.7** | අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර | **15** |
| **14** | | | |
| | **3.4** | කාර්ය මණ්ඩලය සඳහා කුසලතා සංවර්ධන පුහුණුව **- 2018** | **15** |
| | **3.9** | විශේෂ ක්‍රියාකාරකම් | **16-19** |
| | **3.10** | පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන | **20** |
| | **3.11** | ජාතික සහ අන්තර්ජාතික මට්ටම්වලදී අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දායකත්වය | **20** |
| | **3.8** | පුනරුත්ථාපන සහ ඉදි කිරීම් **- 2018** | **21** |
| **04.** | ශිෂ්‍ය පැතිකඩ | | **21** |
| | **4.1** | **BAMS** සහ **BUMS** උපාධි වැඩසටහන් පිළිබඳ විස්තර | **21-23** |
| | **4.2** | ආයුර්වේද සහ යුනානි උපාධි වැඩසටහන්වල ඉලක්ක සහ අරමුණු | **23** |
| | **4.3** | උපාධි අපේක්ෂක සිසුන් බඳවා ගැනීම **(31.12.2018** දිනට**)** | **23-24** |
| | **4.4** | ශිෂ්‍ය සුබසාධනය | **25** |
| | | **4.4.1** මූල්‍ය සහාය | **25** |
| | | **4.4.2** ශිෂ්‍ය නේවාසිකාගාර | **26-27** |
| | **4.5** | ආයතනයේ ශිෂ්‍ය සංගම් | **28** |
| | **4.6** | ආයුර්වේද ශික්ෂණ රෝහල | **28** |
| | **4.7** | ත්‍යාග සහ රන් පදක්කම් | **29** |
| **05.** | මූල්‍ය සහ ගිණුම්කරණ විස්තර | | **29-32** |

1.1 හැඳින්වීම

දහනව වන ශතවර්ෂය අවසානයේ දී, එවකට සිලෝන් ලෙස හැඳින් වූ, බ්‍රිතාන්‍ය යටත් විජිතයට, දේශීය වෛද්‍ය ක්‍රමයක් තිබූ නමුත්, දේශීය වෛද්‍ය අධ්‍යාපනය සැපයීමට විද්‍යාලයක් නොවීය. ඇති කරන ලද ආයතන හෝ සංවිධාන තුනක් විසින් සාම්ප්‍රදායික වෛද්‍ය දැනුම සංරක්ෂණය කිරීම සහ පෙරදිග වෛද්‍ය ක්‍රමය භාවිතා කරන වෘත්තිකයින්ගේ වෘත්තීය තත්ත්වය ආරක්ෂා කිරීම සඳහා මූලික කටයුතු සිදු කරන ලදී. මෙම සංගම් වූයේ "සිංහල වෛද්‍ය සංගමය (1891), ශ්‍රී ලංකා වෛද්‍ය මහ මණ්ඩලය (1901), සහ ශ්‍රී ලංකා සමාජ ප්‍රතිසංස්කරණ සංගමය (1915) ය. ශ්‍රීමත් සොලමන්, ආර්. ඩයස් බණ්ඩාරනායක, එෆ්.ආර්. සේනානායක, කේ. බාලසිංහම්, ඩොනල්ඩ් උභයසේකර සහ ආනන්ද කුමාරස්වාමි යනාදී සම්මානිත පුද්ගලයන් මේ සඳහා අරමුදල් සම්පාදනය කිරීමෙහි යෙදුණු දේශමාමකයන්‍ය.

වර්ෂ 1926 දී, මුල්ම වතාවට, දේශීය වෛද්‍ය ක්‍රමය ගැන සොයා බැලූ කමිටුවක්, මෙම වෛද්‍ය ක්‍රමය අනුගමනය කිරීමට උනන්දුවක් දක්වන අය සඳහා පුහුණුවක් ලබා දීමට යාබද ශික්ෂණ රෝහලක් සහිත විද්‍යාලයක් පිහිටුවීමට යෝජනා කළේය. 1928 දී එවකට පැවති රාජ්‍ය මන්ත්‍රණ සභාව විසින් 'ආයුර්වේද සම්මේලන සභාව' නමින් උපදේශක සභාවක් ආචාර්ය කේ. බාලසිංහම් මහතාගේ සභාපතිත්වයෙන් යුතුව පත් කරන ලදී. මෙම කමිටුවේ නිර්දේශ මත පදනම්ව, "ස්වදේශීය වෛද්‍ය විද්‍යාලය" (දේශීය වෛද්‍ය විද්‍යාලය) යනුවෙන් නම් කරන ලද ආයතනයක් 1929 ජුනි 10වන දින ස්ථාපනය කරන ලද අතර එය එවකට ලංකාවේ අග්‍රාණ්ඩුකාරවරයා වූ, ජෙනරාල් ශ්‍රීමත් හර්බට් ජේම්ස් ස්ටැන්ලි විසින් බොරැල්ල, කොටා පාරේ පිහිටි බවර් ගොඩනැගිල්ලේදී සමාරම්භ කරන ලදී. ඉන්දියාවෙන් පැමිණි ආචාර්ය ඒ. එන්. එන්. පනික්කාර් මහතාට බටහිර වෛද්‍ය විද්‍යාව පිළිබඳ සුදුසුකම් සහ ආයුර්වේද විද්‍යා පිළිබඳ මනා පුහුණුවක් තිබූ අතර ඔහුව එම අලුතින් පිහිටුවන ලද විද්‍යාලයෙහි පළමු විදුහල්පති ලෙස එවක රජය විසින් පත් කරන ලදී. ඒ හා සමානව, වෛද්‍ය එච්. එම්. ජාෆර් සහ වෛද්‍ය එච්. අහමඩ් යන ඉන්දියානුවන්ද යුනානි වෛද්‍ය ක්‍රමය දියුණු කිරීමට කැඳවන ලදී.

දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ තවත් වැදගත් සංධිස්ථානයක් වන්නේ 1941 අංක 17 දරණ දේශීය වෛද්‍ය ආඥාපනත ක්‍රියාත්මක කිරීමයි. ගරු එස්.ඩබ්ලිව්.ආර්.ඩී. සෞඛ්‍ය අමාත්‍යවරයා සහ දේශීය වෛද්‍ය උපදේශක සභාවේ සභාපතිවරයා වශයෙන් ජාතික ප්‍රමිතියක් සහිතව විද්‍යාලයේ ඉගැන්වීමෙහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා නීති සම්පාදනය කර ඇත. වර්ෂ 1961 දී, 1941 අංක 17 දරණ දේශීය වෛද්‍ය ආඥාපනත අහෝසි කර 1961 අංක 31 දරන ආයුර්වේද පනත සම්පාදනය කරන ලද අතර විද්‍යාලය රජයේ දේශීය වෛද්‍ය විද්‍යාලය ලෙස යළි නම් කර ආයුර්වේද විද්‍යාල හා රෝහල් මණ්ඩල පාලනය යටතට ගෙන එන ලදී. මෙය ආයුර්වේද සෞඛ්‍ය සේවා සැපයුම සහ ආයුර්වේද, යුනානි හා සිද්ධ යන වෛද්‍ය ක්‍රමවල අධ්‍යාපනයෙහි ගුණත්වය වැඩි කිරීම සඳහා ගන්නා ලද පියවරකි. නම් වශයෙන් ආයුර්වේද වෛද්‍ය සභාව, ආයුර්වේද විද්‍යාලය සහ රෝහල් මණ්ඩලය, ආයුර්වේද පර්යේෂණ කමිටුව සහ ආයුර්වේද ඖෂධ සම්පාදන කමිටුව යන ආයතන හතරක් පිහිටුවන ලදී.

දේශීය වෛද්‍ය හා ශල්‍ය වෛද්‍ය ඩිප්ලෝමා (DIMS) පාඨමාලාව, 1963 දී නව ආයුර්වේද පනත යටතේ ආයුර්වේද වෛද්‍ය හා ශල්‍ය වෛද්‍ය ඩිප්ලෝමාව (DAMS) යනුවෙන් නම වෙනස් කරන ලදී.

1977 දී, දේශීය වෛද්‍ය විද්‍යාලය, දේශීය වෛද්‍ය විද්‍යායතනය ලෙස අන්තර්ග්‍රහණය කළ අතර, 1972 අංක 1 විශ්වවිද්‍යාල පනත යටතේ කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ කරන ලදී. 1977 මාර්තු මස 30 දිනැති අංක 258 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 1977 අංක 1 දරන ආයුර්වේද ආයතන පනත ප්‍රකාරව මෙය සිදු කරන ලදී. මෙම පියවරේ අරමුණ වූයේ ආයුර්වේද, යුනානි සහ සිද්ධ වෛද්‍ය ක්‍රමවල සුදුසුකම් ලත් වෛද්‍ය වෘත්තිකයන් බිහිකිරීමයි. 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත යටතේ 1979.12.21 දිනැති අංක 67/14 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 1979 අංක 7 දරණ දේශීය වෛද්‍ය විද්‍යායතන ආඥා පනත පළ කරන ලදී. මෙම පනත යටතේ, සිද්ධ අංශය යාපනය විශ්වවිද්‍යාලයට මාරු කොට අනුබද්ධ කරන ලදී.

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ අනුමැතිය ඇතිව විෂයමාලාවට බොහෝ වෙනස්කම් සිදු කර ඇත. එවැනි විශාල සංශෝධනයක් වූයේ 1982 දී ආයුර්වේදය, සිද්ධ සහ යුනානි හි විවිධ අංශවල විශේෂඥයින්ගේ සහාය ලෝක සෞඛ්‍ය සංවිධානයේ ආයුර්වේදය පිළිබඳ උපදේශක මහාචාර්ය පී.එන්.වී. කුරුප්, විසින් ලබා ගැනීමය.

1977 දී ආයතනය ස්ථාපිත කිරීමත් සමඟ, ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හා ශල්‍යය (BAMS) සහ යුනානි වෛද්‍ය විද්‍යාව සහ ශල්‍යය (BUMS) යන උපාධි පාඨමාලා දෙකක් ආයතනයේ අංශ දෙකකින් ආරම්භ කරන ලද අතර 1983 දී පළමු කණ්ඩායම උපාධි ලබා ගන්නා ලදී. මෙම උපාධි 1992.10.26 වන දින කොළඹ විශ්වවිද්‍යාලයේ පැවති උපාධි ප්‍රදානෝත්සවයේදී පිරිනමන ලදී.

ආරම්භයේ සිටම, බොරැල්ල ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල ප්‍රායෝගික දැනුම සහ නිපුණතා ලබා දීම සඳහා වූ සම්පත් ලබා දීමේ මධ්‍යස්ථානය වශයෙන්, විශේෂයෙන්ම සායනික සැකසුම්ක් තුළ කටයුතු කර ඇත. ආයතනය සතුව ඉගැන්වීමේ වගකීම් දරණ පශ්චාත් උපාධි සුදුසුකම් ලත් අධ්‍යයන කාර්ය මණ්ඩලයක් සිටින අතර අධ්‍යයන වර්ෂ පහ තුළදී විවිධ විෂයයන් 23ක් දැන් ඉගැන්වේ. විෂය මාලාව තුළ නිපුණ දේශීය වෛද්‍ය උපාධිධාරියෙකු බිහි කිරීම සඳහා ආයුර්වේදය/ යුනානි සහ වෙනත් අදාළ විද්‍යා පිළිබඳ අධ්‍යයන ද්‍රව්‍ය අඩංගු වේ. සෑම අධ්‍යයන වර්ෂයක්ම සති තිහකින් (30)ක ඉගැන්වීමක් සහිත වාර තුනකින්, මධ්‍ය වාර නිවාඩු දෙකක් සහිතව සමන්විතය. එක් එක් අධ්‍යයන වර්ෂය අවසානයේදී, වාර්ෂික පරීක්ෂණ පැවැත්වේ. සෑම විභාගයක්ම ලිඛිත, viva-voce සහ ප්‍රායෝගික / සායනික අංගයන්ගෙන් සමන්විත වේ.

**දේශීය වෛද්‍ය විද්‍යායතනය (IIM) අංශ දෙකකින් සමන්විතය**

## 1. ආයුර්වේද අංශය

ශ්‍රී ලංකාවේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමයෙහි මුල්ම යොමුව මහා වෛද්‍යවරයෙකු සමග සම්බන්ධ වී තිබේ; එනම් ප්‍රාග් ඓතිහාසික යුගය දක්වා දිවෙන ශ්‍රී ලංකාවේ රාවණා රජුය. සාම්ප්‍රදායිකව, රාමායනයෙහි රාවණා ආයුර්වේද වෛද්‍ය ක්‍රමය පිළිබඳ හසල දැනුමක් ඇති අයකු බව විශ්වාස කෙරේ. ඉන්දියාවේ හිමාලය පෙදෙසෙ පදනම් වූ වෛද්‍ය සමුළුවකදී ඔහු ශ්‍රී ලංකාව නියෝජනය කළ බව රාමායනය සඳහන් කරයි. මෙම කාලයේදී ශ්‍රී ලංකාවෙහි යක්ෂ, රාක්ෂ, නාග සහ වැද්දන් යන ගෝත්‍ර හතරක් විය. ශ්‍රී ලංකාවේ ඉතිහාස විද්‍යාව අනුව රාවණා රජු ආයුර්වේදය පිළිබඳ පහත සඳහන් වෛද්‍ය කෘතිවල කතුවරයා විය. ආර්කප්‍රාක්ෂය, නාඩිවිඥානය, කුමාරතන්ත්‍රය සහ උඩිශාතන්ත්‍රය.

ශ්‍රී ලංකාව ආවේණික ඖෂධීය ශාක වර්ග රාශියකින් පොහොසත් රටකි. ශාකවලින් බහුතරයක් ඉන්දියාවේ භාවිතා කළ ආකාරයටම භාවිත වේ. දොළුකන්ද සහ රුමස්සල යනු රාම රජුගේ පුරාවෘත්තයෙහි සඳහන් වානර රජු හනුමාන් ශ්‍රී ලංකාවට ගෙන එන ලද හිමාලයෙහි කොටසක් බව විශ්වාස කෙරේ. ප්‍රාග් ඓතිහාසික සොහොන් බිම්වලින් සොයා ගන්නා ලද සාක්ෂි අනුරාධපුරය, පොළොන්නරුව, මැදිරිගිරිය සහ පොම්පරිප්පු හරහා ආයුර්වේදයෙහි පෞරාණික භාවිතා ගැන සඳහන් කරයි.

මිහින්තලේ, මැදිරිගිරිය සහ පොළොන්නරුවේ ආලාහණ පිරිවෙණ ආදී පැරණි සංඝාවාසවල ඇති අවශේෂ ව්‍යුහ පුරාණ රෝහල්වල දැනට හඳුනාගෙන ඇති ව්‍යුහ කොටස් බවට හෙළි වී ඇත. එම රෝහල්වල අනන්‍යතාව සෙල් ලිපි සහ ඖෂධ සහ වෙනත් උපකරණ සොයා ගැනීමත් සමඟ තහවුරු කර තිබේ. මහාවංශය සහ චූලවංශය තුළ සඳහන් වන පරිදි පැරණි රජවරුන් බොහෝ දෙනා ශ්‍රී ලංකාවේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාව සංවර්ධනය සඳහා ඔවුන්ගේ සේවය කැප කර ඇත. එවැනි ක්‍රියා සඳහා උදාහරණ ලෙස පණ්ඩුකාභය රජු (ක්‍රි.පූ. 4වන සියවස), සේන රජු (ක්‍රි.ව. 851-885), බුද්ධදාස රජු (ක්‍රි.ව. 362-409), ධාතුසේන රජු (ක්‍රි.ව. 460-478) දැක්වේ. රටෙහි දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ තේජවත් ඉතිහාසයක් උරුම වි තිබූ බව එවැනි පැරණි ආයුර්වේද සාක්ෂිවලින් දැක් වේ. නමුත් 16 වන ශතවර්ෂයේ අග භාගයේ දී විදේශීය ආක්‍රමණ හේතුවෙන් එය අස්ථාවර විය. ඉන් පසුව ආයුර්වේදය ස්වාධීන ක්‍රියාවලියක් තුළ තනිවම වැඩි දියුණු විය. සාම්ප්‍රදායික ක්‍රියාවලියක් ලෙස එය භාවිතයට ගන්නා ලදී. (මාපිය උරුමය) උදා: ඇස් වෙදකම (අක්ෂි වෛද්‍ය විද්‍යාව) ගෙඩිවණ (ගෙඩි සහ වණ සඳහා ප්‍රතිකාර), සර්පවිෂ (විෂවේදය), පිස්සුබලු (ජලභීතිකාව), විදුම්පිළිස්සුම් (පිළිස්සුම්), කැඩුම් බිඳුම් (අස්ථි බිඳීම හා විස්ථානය).

වර්තමානයේදී ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් 16,800 ක් පමණ ලියාපදිංචි වී ඇති අතර එයින් 5000 කට වැඩි පිරිසක් අධ්‍යාපනික හා ආයතනික වශයෙන් රටට සහ ජාතියට සේවය කිරීමට සුදුසුකම් ලබා තිබේ.

## 2. යුනානි අංශය

යුනානි වෛද්‍ය විද්‍යාවේ ඉතිහාසය ඇරඹෙන්නේ පෙරිකල්ස් යුගය (ක්‍රි.පූ. 562-430) සමඟ වන අතර අරාබි ශිෂ්ඨාචාරය අතරතුර එය වර්ධනය විය. එබැවින්, එය අරාබි වෛද්‍ය විද්‍යාව ලෙස ද හැඳින්වේ. මධ්‍යකාලීන යුගයේ දී නාවිකයින් වූ අරාබිවරුන්ට, ප්‍රධාන වශයෙන්ම ඉන්දියාව සමඟ වාණිජ සම්බන්ධකම් තිබුණද, පසුව ඔවුන් ශ්‍රී ලංකාව සමග සෘජු වෙළඳාමක් පැවැත්වූහ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ශ්‍රී ලංකාවේ, විශේෂයෙන්ම වෙරළබඩ ප්‍රදේශවල පදිංචි වූහ.

21වන ශතවර්ෂයේ දී පවා ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් මෙම ක්‍රමය ව්‍යාප්ත කර සංරක්ෂණය කර තබා ගත්තේය. එහි ප්‍රමුඛයා වූයේ බොහාරත් (හිපොක්‍රටීස් ක්‍රි.පූ. 460-360) නම් අයකු වන අතර ඔහු තවමත් "වෛද්‍ය විද්‍යාවේ පියා" ලෙස සැලකෙන අතර, ත්‍රිදෝෂ වාදයෙහි බලධරයා ඔහු විය. ශ්‍රේෂ්ඨ දාර්ශනික අරාස්තු (ඇරිස්ටෝටල් ක්‍රි.පූ. 384-322) යුනානි වෛද්‍ය විද්‍යාවේ ඊළඟ ප්‍රමුඛ චරිතය විය. ජාලිනූස් (ගැලෙන් ක්‍රි.පූ. 131-210) අරාබිවරුන්ට ව්‍යවච්ඡේදක දැනුම හඳුන්වා දුන්නේය.

එතැන් සිට යුනානි පද්ධතිය සංවර්ධනය සඳහා දායක වූ බොහෝ බලධාරීන් විය. ඉබන් සිනා (අවිසෙන්නා 937-1037) යුනානි වෛද්‍ය ක්‍රමයේ වඩාත්ම ජනප්‍රිය වෛද්‍යවරයා සහ දාර්ශනිකයා විය. වෛද්‍ය විද්‍යාවට ඔහු දැක්වූ දායකත්වය අතර විශ්වකෝෂයක් සහ වෛද්‍ය විද්‍යාව පිළිබඳ පෙළ පොතක් වන “Canon of Medicine” වේ. පළමුවන සියවසේදී අරාබිවරුන් මෙම ක්‍රමය ශ්‍රී ලංකාවට ගෙන ආ අතර මුස්ලිම්වරුන්ද එය වැඩිදියුණු කළහ. ඉතිහාසය හෙළිදරව් කරන්නේ අරාබි කායික වෛද්‍යවරුන් රටේ විවිධ රාජධානිවල රජුන්ගේ පවුලේ උපදේශකයන් බවට පත්ව සිටි බවය. යුනානි වෛද්‍ය ක්‍රමයෙහි ඵලදායී බව සහ වටිනාකම හඳුනා ගෙන, සම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමයට එය එක්ව ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමය ලෙස ආයුර්වේදය අන්තර්ග්‍රහණය විය. ශ්‍රී ලංකාවේ සියලු සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම 1961 ආයුර්වේද පනත මගින් එක් ස්ථානයකට ගෙන ඇත. ඒ අනුව "ආයුර්වේද" යන්නට ආයුර්වේදය, යුනානි, සිද්ධ සහ ආසියානු රටවලට දේශීය වූ අනෙකුත් සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම ඇතුළත් වේ.

පසුව සිදු වූ විදේශීය ආක්‍රමණ හා සටන්වල ප්‍රතිඵලයක් ලෙස රාජාණ්ඩුවේ බලය බිඳ වැටුණු අතර, සියවස් ගණනාවකට පෙර රාජකීය අනුග්‍රහය ලද ආයුර්වේදය වෙනත් පුරාතන කලා ශිල්ප සමඟ පිරිහීමට පත් විය. ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා සංවිධිත පුහුණුව නැවත ආරම්භ කරන ලද්දේ මෙම සියවස ආරම්භයේදීය.

ආයුර්වේදය ඇතුළු දේශීය කලා සහ විද්‍යා පුනර්ජීවනය කිරීමේ අරමුණින් ලංකා සමාජ ප්‍රතිසංස්කරණ සංගමය පිහිටුවන ලදි. අරමුදල් නොමැතිකම නිසා අවහිර වූ සංගමයේ ඉහළ ප්‍රමුඛතාවයක් වූයේ ආයුර්වේදය පුනර්ජීවනයයි. යටත් විජිත ආණ්ඩුවේ අනුග්‍රහය නොමැතිව, එහි අරමුණු ප්‍රවර්ධනය කිරීම සඳහා පුද්ගලික දායකත්වය මත රඳා පැවතීමට එයට සිදු විය. රු .131,000ක් වූ දායක මුදල් පොරොන්දු විය. මෙම මුදල් තැන්පත් කරන ලද්දේ පෙරදිග වෛද්‍ය විද්‍යා අරමුදල යටතේය. එය පෝල් එච්. පීරිස් මහතාගේ සභාපතිත්වයෙන් යුතු භාරකාර මණ්ඩලයක් මගින් පාලනය කරනු ලැබීය. 1916 දී, රෝහලක් පිහිටුවීමේ අදහස භාරකරුවන්ට ඇති විය.

1917 දී භාරකාර මණ්ඩලය විසින් ජී. පී. වික්‍රමාරච්චි සහ ආර්. බුද්ධදාස යන අයව කල්කටාවේදි පුහුණුව ලැබීමට තෝරා ගන්නා ලදි. ඔවුන්ගේ තේරීම අනාගතය හෙළිදරව් කරන්නක් (ආයුර්වේදය සංවර්ධනය) වූ අතර එම වෘත්තිය සඳහා ඔවුන්ගේ දායකත්වය කැපී පෙනෙන්නක් විය. පණ්ඩිත් වික්‍රමාරච්චි 1929 දී , තමාගේම විද්‍යාලයක් පිහිටුවන ලදී.

භාරකාර මණ්ඩලය 1929 දක්වා ශිෂ්‍යයන් දිගටම ඉන්දියාවට යැවීමට කටයුතු කළේය. වර්ෂ 1929 දී දේශීය වෛද්‍ය විද්‍යාලය ස්ථාපිත කිරීමේදී, ආචාර්ය කේ. බාලසිංහම් සහ ශ්‍රීමත් රසීක් ෆරීඩ්ගේ අප්‍රතිහත වෙහෙස හේතුවෙන් යුනානි වෛද්‍ය ක්‍රමයද ආයුර්වේද සහ සිද්ද වෛද්‍ය ක්‍රම සමගින් ස්ථාපනය කරන ලදී. ආචාර්ය එම්.ඒ. අහමඩ් සහ ආචාර්ය එච්. එම්. ජැෆර් යන අයට ඉන්දියාවේ යුනානි කථිකාචාර්යවරුන් ලෙස ආරාධනා කරන ලදී. ඔවුන් විද්‍යාලයේ යුනානි අංශය සංවිධානය කිරීම හා ස්ථාපනය කිරීම සඳහා වඩාත්ම දායක වූවනා. ආචාර්ය එච්. එම්. ජැෆර් එවකට දේශීය වෛද්‍ය විද්‍යා මණ්ඩලයේ සාමාජිකයෙකු වූ ශ්‍රීමත් රසික් ෆරීඩ් සමග එක්ව විද්‍යාලයේ යුනානි අංශය පවත්වා ගෙන යාමට ගත් වෑයම සඳහන් කළ යුතුය. යුනානි අංශයේ ප්‍රධාන කථිකාචාර්යවරයා ආචාර්ය එච්. එම්. ජැෆර් මහතා විය. ආචාර්ය එම්. එච්. එම්. හෆීල්, ආචාර්ය එම්. ඒ. එම්. ජලල්ඩීන් සහ ආචාර්ය එම්. අයි. විලියම් යන අය යුනානි අංශයේ ප්‍රධානීන් ලෙස තනතුරු දැරූහ. මෙම කාලය තුළ යුනානි අංශය සංවර්ධනය කිරීමට ඔවුන් සියලු දෙනා දැඩි වෙහෙසක් දැරූහ.

# ආයතනයේ සංවිධාන ව්‍යුහය



## 01. ආයතනයේ අධිකාරීන්:

### 1.1 ආඥාපනත

දේශීය වෛද්‍ය විද්‍යායතනය 1979 අංක 07 දරන ආඥා පනත යටතේ කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ කර ඇත.

### 1.3 කළමනාකරන මණ්ඩලය

**(අ) නිල බලයෙන් සාමාජිකයින්**

ආචාර්ය එස්.ඩී. හපුආරච්චි / ජ්‍යොෂ්ඨ මහාචාර්ය ප්‍රියානි .ඒ. පරණගම

**අධ්‍යක්ෂ (සභාපති)**

ආචාර්ය පී. ආර්. වරාතැන්න මිය / ආචාර්ය එල්.පී.ඒ. කරුණාතිලක මහතා
**අංශාධිපති/ ආයුර්වේද**

වෛද්‍ය එම්.අයි. මනුහා
**අංශාධිපති/ යුනානි**

ජේ.එම්.සී.ජේ විජෙතුංග මහත්මිය
**අතිරේක ලේකම්/ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය**

එල්.එච් තිලකරත්න මහත්මිය
**අතිරේක ලේකම්/ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය විද්‍යා අමාත්‍යාංශය**

ඒ.වී ජනාදාර මහතා
**ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ**

එම්.ඩී.ජේ.සී. මුරගේ මයා
**නියෝජ්‍ය අධ්‍යක්ෂ, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව**

**එම්.ඩී.එම්.කාරුණාතිලක මෙය / කේ.ඩී.එස්. කුමාරතුංග මයා**

**ආයුර්වේද කොමසාරිස්**

ආචාර්ය එම්.ඩී.ජේ. විජයබණ්ඩාර

**අධ්‍යක්ෂ/ බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණ ආයතනය**

ආචාර්ය ජේ.සී.කේ.ඩී කුමාරසේකර මෙය

**අධ්‍යක්ෂ/ ආයුර්වේද ශික්ෂණ රෝහල**

මහාචාර්ය ජෙනිෆර් පෙරේරා

**පීඨාධිපති/ වෛද්‍ය පීඨය**

මහාචාර්ය එස්. එස්. බී. ඩී. පී. සොයිසා

මහාචාර්ය ප්‍රියදර්ශනී ගලප්පත්ති

ආචාර්ය චමරි වීරරත්න

**වෛද්‍ය පීඨ සාමාජිකයින්**

වෛද්‍ය එස්. එම්. එච්. සේනබණ්ඩා මහතා

**ආයුර්වේද වෛද්‍ය සභාවේ සාමාජික**

සී. මාලියද්ද මයා

එම්. ඩී. ඩී. පීරිස් මහතා

කේ. ආර්. උඩුවාවල මහතා

මහාචාර්ය සුමනරත්න අමරතුංග

ආචාර්ය මාලිනී අමරසිංහ කුරුප්පු මෙය

ආචාර්ය එම්. ඩී. ජේ. අබේගුණවර්ධන මහතා

ආචාර්ය ටී ප්‍රසාද් හෙන්දවිතාරණ මහතා

ආචාර්ය එච්. චින්තක නාදුගල මහතා

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කළ සාමාජිකයින්**

ටී.එම්.එච්.පී.කේ ගුණතිලක මහත්මිය (නියෝජ්‍ය ලේඛකාධිකාරි)

අයි.කේ. විජේකෝන් මිය (ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි)

**ලේකම්**

## 1.4 අධ්‍යක්ෂ -ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රියංගනී ඒ පරණගම

කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යායතනයේ අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රියානි ඒ. පරණගම 2018 පෙබරවාරි 10 වන දින රාජකාරි භාර ගත්තාය. ඇය 1986 වසරේදී කැලණිය විශ්වවිද්‍යාලයෙන් රසායන විද්‍යාව පිළිබඳව ගෞරව උපාධියක් සමගින් සිය උපාධිය ලබා ගත්තාය ඇය 1990 වසරේදී පරිවාස කථිකාචාර්යවරියක වශයෙන් කැලණිය විශ්වවිද්‍යාලයට එක් වූ අතර, 1991 දී කාබනික රසායන විද්‍යාව පිළිබඳ ඇයගේ දර්ශනශූරී උපාධිය ලබා ගැනීමට කර්මාන්ත සහ තාක්ෂණික ආයතනයට ඇතුළු වූවාය. ඇය 1994 වසරේදී එක්සත් රාජධානියේ ග්ලාස්ගෝ විශ්වවිද්‍යාලයෙන් සිය ආචාර්ය උපාධිය, ජෛව කාබනික රසායන විද්‍යා ක්ෂේත්‍රයෙන් ලබා ගත්තාය. ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසු ඇය ස්වාභාවික නිෂ්පාදන රසායන විද්‍යාව පිළිබඳ ස්වාධීන පර්යේෂණ වැඩ ආරම්භ කළාය. 2003 වසරේදී මහාචාර්යවරියක ලෙසද පසුව 2011 වසරේදී ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරියක ලෙසද උසස්වීම් ලැබූ ඇය, 2012 දී රසායන විද්‍යාව පිළිබඳ මූලාසනයට පත් වූවාය ඇය 2016 ජූනි සිට 2017 ඔක්තෝබර් දක්වා ලංකා රසායන විද්‍යා ආයතනයෙහි රසායන විද්‍යා විද්‍යාලයෙහි පීඨාධිපති ලෙස සේවය කළාය 2009 සිට 2012 වසර දක්වා ඇය කැලණිය විශ්වවිද්‍යාලයෙහි අංශ ප්‍රධානී ලෙස සේවය කළාය. ඇය 2019/2020 වසරේ ලංකා රසායන විද්‍යා ආයතනයෙහි සභාපතිනියයි. ලංකා රසායන විද්‍යා ආයතනයෙහි අධි සාමාජිකයෙකු වන ඇය රසායන විද්‍යාව පිළිබඳ රාජකීය සංගමයෙහි වරලත් රසායනඥයෙකි (CChem). ඇය ලංකාවේ වෘත්තිය ආයතන කිහිපයකම සාමාජිකයෙකි. ඇයට ලෝක විද්‍යා සංගමය (TWAS) මගින් සංවිධානය කළ විද්‍යාව තුළ වෘත්තීන් හැඩගැස්වීම පිළිබඳ සම්මන්ත්‍රණයට සහභාගී වීම සඳහා ඇරයුම් කරන ලද අතර, එම සම්මන්ත්‍රණය TWAS ප්‍රදාන ලබන ලොව ප්‍රමුඛ රසායනඥයන් විසින් සංවිධානය කරන ලදී. තවද ඇයට 2015 වසරේදී රසායන විද්‍යා පිළිබඳ කැපී පෙනෙන පර්යේෂණ සඳහා වන ආචාර්ය සී. එල්. ද සිල්වා රන් පදක්කම සහ 2018 වසරේදී ඇයගේ පර්යේෂණ වෘත්තියේ ජයග්‍රහණ වෙනුවෙන් මහාචාර්ය එම්. යූ. එස්. සුල්තාන්බාවා රන් පදක්කම ප්‍රදානය කරන ලදී. ඇය ජාතික සහ ජාත්‍යන්තර ප්‍රදාන සහ සම්මාන ගණනාවක් ලබා ගෙන ඇත. ඇය සගයන් විසින් සමාලෝචිත සුවිගත කල ජර්නල්වල පර්යේෂණ පත්‍රිකා 50කට වඩා පළ කර ඇති අතර පොත් 7කට වඩා ලියා හෝ සංස්කරණය කොට සංදේශ 100කට වඩා ප්‍රකාශයට පත් කර ඇත. ඇය පශ්චාත් උපාධි සිසුන් 16කට වඩා වැඩි ගණනක් සාර්ථකව අධීක්ෂණය කර තිබෙන අතර දැනට ස්වාභාවික නිෂ්පාදන ඒකලනය සිට විශේෂාංගීකරණය, කුළු බඩු සහ අත්‍යවශ්‍ය තෙල් විශ්ලේෂණය, ස්වාභාවික නිෂ්පාදනවලට අගය එක් කිරීම සහ අංශුමය ලෝහවල විෂ වීම දක්වා පරාසයක රසායන විද්‍යාවේ විවිධ ක්ෂේත්‍ර ගණනාවක පශ්චාත් උපාධි සිසුන් අට දෙනෙකු අධීක්ෂණය කරමින් සිටී. ඇයගේ පර්යේෂණ රුචිකත්ව වන්නේ ශාක සහ එන්ඩොලිචනික දිලීරවල ජෛව සක්‍රිය ස්වාභාවික නිෂ්පාදනවල ඒකලනය සහ විශේෂාංගීකරණය, ජෛව වල්නාශක සංවර්ධනය සහ ස්වාභාවික නිෂ්පාදනවල අගය එක් කිරීමය.

## 1.4 අධ්‍යයන කමිටු

### 1.4 (1) ආයුර්වේද අංශීය කමිටුව

දේශීය වෛද්‍ය විද්‍යායතනයේ ආයුර්වේද අංශයේ අදාළ සියලු අංශවල අධ්‍යයන පාඨමාලා, පුහුණු කිරීමේ වැඩසටහන් සහ විභාග සම්බන්ධ සියලු කටයුතු පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමේ වගකීම අංශීය කමිටුව වෙත පවරා ඇත.

1979 අංක 7 දරන දේශීය වෛද්‍ය විද්‍යායතන නියමාවලියේ 15(1) ඡේදයට අනුකූලව පහත පරිදි 2013 වර්ෂයේදී අංශීය කමිටුව පත් කොට ඇත.

ආයුර්වේද අංශීය කමිටුවේ සභාපති - අංශ ප්‍රධාන/ආයුර්වේද
වෛද්‍ය L.P.A. කරුණාතිලක/වෛද්‍ය P.R.වරාතැන්න මිය
සියලු ස්ථිර කථිකාචාර්යවරුන් අංශීය කමිටුවේ සාමාජිකයන් වේ.

### 1.4 (2) යුනානි අංශීය කමිටුව

යුනානි අංශීය කමිටුවේ සභාපති - අංශ ප්‍රධානි/යුනානි
වෛද්‍යා එම්.අයි. මනුහා
සියලු ස්ථිර කථිකාචාර්යවරුන් යුනානි අංශීය කමිටුවේ සාමාජිකයන් වේ.

## 02. අධ්‍යයන අංශ, සහ ඒකක

### 2.1 ආයුර්වේද අධ්‍යයනාංශ යටතේ ඇති ඒකක

ආයුර්වේද අධ්‍යයනාංශය නම් වශයෙන් ඒකක අටකින් (08) සමන්විත වේ,

I. මෞලික සිද්ධාන්ත
II. ද්‍රව්‍ය ගුණ විඥාන
III. ස්වස්තවෘත්ත
IV. කාය චිකිත්සා
V. දේශීය චිකිත්සා
VI. ප්‍රසූතන්ත්‍ර කෞමාරභෘත්‍ය
VII. ශල්‍ය ශාලක්‍ය
VIII. සමාන්තර විද්‍යා (ආයුර්වේද සහ යුනානි යන දෙඅංශයටම පොදුය)

### 2.2 යුනානි අධ්‍යයනාංශය යටතේ ඇති අංශ

යුනානි අධ්‍යයනාංශය නම් වශයෙන් ඒකක අටකින් (08) සමන්විත වේ,

I. කුල්ලියත්
II. ඉල්මුල් අද්වියා
III. මෞලිජාත්
IV. තිස්වන්ව කබාලත්
V. ඉල්මුල් ජරහත්
VI. හිෆ්සාන් ඒ සේහාත්
VII. දේශීය ඉලාජ්
VIII. සමාන්තර විද්‍යා (ආයුර්වේද සහ යුනානි යන දෙඅංශයටම පොදුය)

### 2.3 තොරතුරු තාක්ෂණ සහ ඉංග්‍රීසි ඒකකය

තොරතුරු තාක්ෂණ හා භාෂා විද්‍යාගාරය 2014 වසරේ මාර්තු මස HETC ව්‍යාපෘතිය **යටතේ පිහිටුවන ලදී.** ශිෂ්‍යයින්ගේ ප්‍රායෝගික පන්ති සඳහා පරිගණක 39ක් ද අන්තර්ජාල පහසුකම් සහිත පරිගණක 16ක් සපයා ඇත.

## 2.4 පුස්තකාලය

දේශීය වෛද්‍ය විද්‍යායතනයේ පුස්තකාලය 1929 වසරේ දී ආයුර්වේද විද්‍යාලය ඇති කිරීමත් සමඟ පිහිටුවන ලදී. ආයතනයේ අධ්‍යාපනික හා පර්යේෂණ වැඩසටහන් සඳහා අවශ්‍ය සම්පත් ලබා දෙමින් ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහ ශිෂ්‍යයින්ගේ තොරතුරු අවශ්‍යතා ඉටු කිරීම පුස්තකාලයේ ප්‍රධාන පරමාර්ථය වේ. ග්‍රන්ථ එකතුව සඳහා මූලික වශයෙන් ආයුර්වේද හා යුනානි වෛද්‍ය ක්ෂේත්‍ර ඇතුළත් වේ. ප්‍රවර්තන වාර සඟරා එකතුවට මුද්‍රිත අනුවාදයේ දායකත්වය ලබා ඇති සඟරා 21ක් ඇතුළත් වේ.

**පුස්තකාල කාර්ය මණ්ඩලයේ විස්තර - 2018**

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| **ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති** | 02 |
| **මාණ්ඩලික සහකාර** | 02 |
| **පුස්තකාල සහ තොරතුරු සහායක (ශ්‍රේණිය II)** | 01 |
| **පුස්තකාල සහ තොරතුරු සහායක (ශ්‍රේණිය III)** | 02 |
| **පුස්තකාල සහායක (ශ්‍රේණිය II)** | 01 |
| **පොත් බැඳුම්කරු (ශ්‍රේණිය II)** | 01 |
| **වැඩ සහායක (ශ්‍රේණිය II)** | 01 |

මිලට ගැනීම් - පුස්තකාලය සඳහා රුපියල් 1,332,567.50ක් වටිනා පොත් සහ වාර සඟරා සහ රු. 2,294,7947.92ක් වටිනා වාර සඟරා මිලදී ගන්නා ලදී.

ප්‍රදාන - පොත් 41ක් ප්‍රදාන ලෙස ලැබී ඇත.

තාක්ෂණික සේවා - 2018 වසර තුළදී බැහැර ගෙන යාමේ පොත් 9430ක් සහ විමර්ශන පොත් 1325ක් නිකුත් කර ඇත.

විශේෂ සේවා - බැහැර දීමේ සේවාව, විමර්ශන සේවාව, වත්මන් දැනුවත් කිරීමේ සේවාව, අන්තර්-පුස්තකාල ණය සේවාව, ඡායාස්ථිති සේවාව, අන්තර්ජාල පහසුකම්

පරිශීලකයන් සංඛ්‍යාව - උපාධි අපේක්ෂක සිසුන් - ආයුර්වේද - 854
- යුනානි - 270

පශ්චාත් උපාධි සිසුන් - MD ආයුර්වේද- 14

අධ්‍යයන කාර්ය මණ්ඩලය - 74
අනධ්‍යයන කාර්ය මණ්ඩලය - 75

## 2.5 පරිපාලන අංශ

පහත සඳහන් පරිදි පරිපාලන අංශ හතක් ඇත.

1. අධ්‍යක්ෂක කාර්යාලය
2. නියෝජ්‍ය ලේඛකාධිකාරි කාර්යාලය
3. නියෝජ්‍ය මූල්‍යාධිකාරි කාර්යාලය
4. මූල්‍ය අංශය
5. ශිෂ්‍ය ලියාපදිංචි සහ සුබසාධන අංශය
6. විභාග අංශය
7. ආයතන අංශය
8. සාමාන්‍ය පරිපාලනය සහ ප්‍රාග්ධන වැඩ අංශය

ආයතනයේ විභාග අංශය සහ සාමාන්‍ය පරිපාලන අංශය නියෝජ්‍ය ලේඛකාධිකාරි යටතේ කටයුතු කරයි. ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි ආයතන අංශය භාරව කටයුතු කරයි. එසේම සහකාර ලේඛකාධිකාරි/ පරිපාලන සාමාන්‍ය පරිපාලන අංශය භාරව කටයුතු කරන අතර සහකාර ලේඛකාධිකාරි/ මූලධන වැඩ සහ ශිෂ්‍ය කටයුතු, මූලධන සහ ශිෂ්‍ය කටයුතු භාරව කටයුතු කරයි. නියෝජ්‍ය මූල්‍යාධිකාරි සැපයීම් සහ ආයතනයේ මූල්‍ය පාලනය භාරව කටයුතු කරන අතර ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි වැටුප් සහ ගෙවීම් භාරව කටයුතු කරයි.

## 03. දේශීය වෛද්‍ය විද්‍යායතනය පිළිබඳ දළ විශ්ලේෂණයක්

### 3.1 රැස්වීම් සහ කමිටු

| | රැස්වීම්වල නම් | වසර තුළ පැවැත්වූ රැස්වීම් ගණන |
|---|---|---|
| (i) | කළමනාකරණ මණ්ඩලය | 18 |
| (ii) | මූල්‍ය කමිටුව | 05 |
| (iii) | විභාග උප කමිටුව | 05 |
| (iv) | සැලසුම් සහ සංවර්ධන කමිටුව | 04 |
| (v) | අධ්‍යයන ඒකක රැස්වීම් | 09 |
| (vi) | අධ්‍යයනාංශ කමිටුව/ ආයුර්වේද | 18 |
| (vii) | අධ්‍යයනාංශ කමිටුව/ යුනානි | 10 |
| (viii) | විගණන සහ කළමනාකරණ කමිටුව | 04 |
| (ix) | පරිපාලන ප්‍රධානිගේ රැස්වීම | 09 |

## 3.2 පත්වීම් සහ කාර්ය මණ්ඩල තොරතුරු:

**මුළු පත්වීම්:**

| | | |
|---|---|---|
| අධ්‍යයන | - | - |
| **පරිපාලන** | **-** | **01** |
| **අනධ්‍යයන** | **-** | **24** |

## 3.3 2018 කාර්ය මණ්ඩලය වෙනස් වීම්:

| කාර්යය | අධ්‍යයන | පරිපාලන | අනධ්‍යයන | අධ්‍යයන සහායක |
|---|---|---|---|---|
| **පත්වීම්** | | **01** | **24** | **-** |
| **ස්ථිර කිරීම්** | | **01** | **-** | **-** |
| **උසස් වීම්** | **04** | **02** | **08** | **-** |
| **මාරු කිරීම්** | | **02** | **03** | **-** |
| **සේවය දිගු කිරීම්** | | **-** | **-** | **-** |
| **විශ්‍රාම ගැනීම්** | **02** | **-** | **-** | **-** |

### 3.4 කාර්ය මණ්ඩල සාමාජිකයන් ගණන - 2018:

| | | | |
|---|---|---|---|
| (i) | ස්ථිර අධ්‍යයන සහ අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය | - | 84 |
| (ii) | ස්ථිර පරිපාලන කාර්ය මණ්ඩලය | - | 07 |
| (iii) | ස්ථිර අනධ්‍යයන කාර්ය මණ්ඩලය | - | 111 |

**කාර්ය මණ්ඩල සාමාජිකයන් ගණන - 2018:**




### 3.5 පරිපාලන කාර්ය මණ්ඩලයේ විස්තර - 2018

| තනතුර | අනුමත සංඛ්‍යාව | සංඛ්‍යාව |
|---|---|---|
| නියෝජ්‍ය ලේඛකාධිකාරි | 02 | 01 |
| නියෝජ්‍ය මූල්‍යාධිකාරි/ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි | 02 | 03 |
| සහකාර මූල්‍යාධිකාරි | 01 | 00 |
| සහකාර ලේඛකාධිකාරි | 02 | 02 |
| මුළු ගණන | 07 | 06 |

## 3.6 ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර - 2018

| | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන් | මහාචාර්යවරුන් | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් | කථිකාචාර්යවරුන් ස්ථිර නොකළ | කථිකාචාර්යවරුන් (පරිවාස) |
|---|---|---|---|---|---|---|
| ආයුර්වේද | සිංහල/ ඉංග්‍රීසි | 02 | 01 | 41 | 02 | 08 |
| යුනානි | දෙමළ/ ඉංග්‍රීසි | - | - | 21 | 01 | 07 |
| මුළු ගණන | | 02 | 01 | 62 | 03 | 15 |

**ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර – 2018**



**3.7 අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර – 2018**

| | ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | කනිෂ්ට කාර්ය මණ්ඩලය | සුළු සේවක කාර්ය මණ්ඩලය |
|---|---|---|---|
| අධ්‍යක්ෂක කාර්යාලය | 01 | 01 | 01 |
| පරිපාලන ශාඛාව | - | 07 | 03 |
| ආයතන ශාඛාව | 01 | 03 | 01 |
| විභාග ශාඛාව | 02 | 02 | 02 |
| ශිෂ්‍ය ලියාපදිංචි සහ සුබසාධන අංශය | 01 | 05 | 01 |
| මූල්‍ය අංශය | 02 | 07 | 02 |
| ආයුර්වේද අංශය | 03 | 06 | 16 |
| යුනානි අංශය | -- | 03 | 02 |
| පශ්චාත් උපාධි අංශය | -- | -- | -- |
| පුස්තකාලය | 01 | 04 | 05 |
| IT අංශය | 01 | -- | 02 |
| මුළු ගණන | 15 | 30 | 53 |

මුළු සාමාජික සංඛ්‍යාව **98**ක් වූ අනධ්‍යයන කාර්ය මණ්ඩලය අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය, කළමනාකාර සහකාර, තාක්ෂණික සහ තාක්ෂණික නොවන, පුහුණු, අර්ධ පුහුණු සහ නුපුහුණු කාර්ය මණ්ඩලය ලෙස පරිපාලන අංශ, අධ්‍යයනාංශ, නඩත්තු සහ උද්‍යාන අංශ යටතේ සේවය කරයි. ආයතනයේ එදිනෙදා කටයුතු පවත්වාගෙන යාම සඳහා ඔවුන්ගෙන් ලැබෙන දායකත්වය ඉතා වැදගත් වේ.

**3.8 කාර්ය මණ්ඩලය සඳහා කුසලතා සංවර්ධන පුහුණුව - 2018**

| | | |
|---|---|---|
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | ආයතනයෙන් බැහැර පුහුණුව | 58 |
| | වෘත්තීය පුහුණුව | 58 |
| සියලු කාර්ය මණ්ඩල ප්‍රවර්ග | ප්‍රසම්පාදන කළමනාකරණ වැඩමුළුව | 30 |
| | මූල්‍ය කළමනාකරණ වැඩමුළුව | 42 |
| | IT වැඩමුළුව | 33 |
| පරිපාලන කාර්ය මණ්ඩලය | වෘත්තීය පුහුණුව | 03 |

## 3.9 විශේෂ ක්‍රියාකාරකම්

**ආයුර්වේද, යුනානි, සිද්ධ සහ සම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණය (ICAUST) - 2019**










කාර්ය මණ්ඩලය සඳහා ආයතනයෙන් බැහැර පුහුණුව සර්වෝදය පුහුණු ආයතනය 2018












## ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) වැඩමුළුව












**ආගමික ක්‍රියාකාරකම් - 2018**
**(පිරිත් පිංකම)**









## 3.10 පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන

| විෂය | ප්‍රකාශයට පත් කළ | ඉදිරිපත් කළ |
|---|---|---|
| උද්ධෘත ගණන | **04** | **02** |
| පර්යේෂණ ගණන | **38** | **20** |
| ජර්නල ගණන | **05** | **02** |
| පොත් ගණන | **02** | |
| ලිපි ගණන | **66** | |
| වෙනත් | | **30** |
| මුළු ගණන | **115** | **54** |

## 3.11 ජාතික සහ අන්තර්ජාතික මට්ටම්වලදී අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දායකත්වය

**01.** ආයතනය විසින් ජංගම ආයුර්වේද සායනයක් 2018 ජූලි අනුරාධපුරයේදී පොසොන් උත්සවය නිමිත්තෙන් සාර්ථකව පවත්වන ලදී.

**02.** ඇසල උත්සවය නිමිත්තෙන් කතරගමදී ජංගම ආයුර්වේද සායනයක් සාර්ථකව පවත්වන ලදී.

**03.** රත්නපුර අල් මැකියා මුස්ලිම් මහා විද්‍යාලයේ වෛද්‍ය කඳවුරක් පවත්වන ලදී 05/09/2018

**04.** "සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් සහ සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක්" පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් ජනාධිපති විද්‍යාලයේ 09වන ශ්‍රේණියේ සිසුන් සඳහා පවත්වන ලදී.

**05.** ආයුර්වේද, යුනානි, සිද්ධ සහ සම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමය පිළිබඳ 6වන අන්තර්ජාතික සම්මන්ත්‍රණය (ICAUST) 2018 ඔක්තෝබර් මස පවත්වන ලදී

## 3.12 පුනරුත්ථාපන සහ ඉදි කිරීම - 2018

| කොන්ත්‍රාත් නම, සංඛ්‍යාව, කොන්ත්‍රාත්තකරු | කොන්ත්‍රාත් මුදල - රු |
|---|---|
| අතිරික්ත අයිතම සඳහා තාවකාලික ගබඩා කාමරයක් ඉදිකිරීම, සහ යතුරුපැදි ගරාජය ඉදිකිරීම AA1/3/2018/05 | **1,682,700/= +VAT** |
| අංක :330 පිරිමි නේවාසිකාගාරයේ කියවීමේ කාමරය අලුත්වැඩියා කිරීම AA1/3/2018/06 | **2,643,885/=** |
| ද්‍රව්‍යගුණ අධ්‍යයනාංශය වැඩි දියුණු කිරීම AA1/3/2018/03 | **4,323,487.30/= +VAT** |
| අධ්‍යයනාංශ කිහිපයක අළුත්වැඩියා කිරීම් සහ වැඩිදියුණු කිරීම් - AA1/3/2018/04 | **5,482,873.40/= +15% VAT** |

## 04. ශිෂ්‍ය පැතිකඩ:

### 4.1 BAMS සහ BUMS උපාධි වැඩසටහන් පිළිබඳ විස්තර

**(i) ආයුර්වේද වෛද්‍ය සහ ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධිය (BAMS)**

**(ii) යුනානි වෛද්‍ය සහ ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධිය (BUMS)**

**මෙම පාඨමාලා වසර පහක 05 ආයතනික අධ්‍යයන පුහුණුවකින්ද එක් වර්ෂයක සීමාවාසික පුහුණුවකින්ද සමන්විත වේ. ඉගැන්වීමේ මාධ්‍යය ඉංග්‍රීසි වන අතර දේශීය වෛද්‍ය විද්‍යායතනයේ සහ බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහලේ ප්‍රායෝගික පුහුණුව පවත්වනු ලැබේ.**

**නව අධ්‍යයන පාඨමාලාව සමාසික ක්‍රමය යටතේ පවත්වාගෙන යනු ලැබේ. එක් එක් අධ්‍යයන වසර සමාසික දෙකකින් සමන්විත වේ. සෑම සමාසිකයක් අවසානයේම විභාගයක් පැවැත්වේ. SLQF 06 අනුව අධ්‍යයන වැඩසටහන පවත්වනු ලැබේ. එක් එක් සමාසිකය සති 15 ක අධ්‍යයන වැඩසටහනකින් සමන්විත වන අතර මුළු සමාසික ගණන 10කි.**

### 4.2 ආයුර්වේද සහ යුනානි උපාධි වැඩසටහන්වල ඉලක්ක සහ අරමුණු

**ඉලක්කය 01: සේවා නියුක්තික හැකියාව සහ උපාධිධාරීන්ගේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම**

**අරමුණු:**
(i)වැඩිවන ගෝලීය අවශ්‍යතා සපුරාලීමට අධ්‍යයන, සායනික සහ පර්යේෂණ හැකියාවලින් යුතු කුසලතා පූර්ණ උපාධිධාරීන් බිහි කිරීම
(ii)2020 වන විට BUMS සහ BAMS උපාධිධාරීන්ගේ රැකියා නියුක්තික හැකියාව 100%කින් වැඩි කිරීම

**ඉලක්කය 2: IIM හි ප්‍රමිතිය ජාත්‍යන්තර විශ්වවිද්‍යාල මට්ටමට ඉහළ නැංවීම**

**අරමුණු:**

(i)ඉගැන්වීම්, ඉගෙනුම් සහ පර්යේෂණ හැකියාව ඉහළ නංවාලීමට ශිෂ්‍යයන් සහ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ඉඩ ප්‍රස්ථා වැඩි කිරීම

**ඉලක්කය 3: උසස් අධ්‍යාපනය සඳහා ඉඩප්‍රස්ථා සහ ප්‍රවේශය වැඩි කිරීම**

(i)ගෝලීය ඉල්ලුම හා සමාන්තරව එක් කළ පිළිගැනීම සහිතව මනා අපේක්ෂාවලින් සහ ඉල්ලුමකින් යුතු පරිසරයක් නිර්මාණය කිරීම

**ඉලක්කය 4: පාර්ශ්වකරුවන්ගේ තෘප්තිය වැඩි දියුණු කිරීම.**

**අරමුණු:**

(i)ශිෂ්‍ය තෘප්තියෙහි ප්‍රතිශත මට්ටම වැඩි කිරීම.

(ii)කාර්ය මණ්ඩල තෘප්තියෙහි ප්‍රතිශත මට්ටම වැඩි කිරීම.

**ඉලක්කය 5: පර්යේෂණ ප්‍රකාශන සහ වාණිජකරණය තුළ විශිෂ්ඨත්වය.**

**අරමුණු:**

(i)පර්යේෂණ ව්‍යාපෘති සංඛ්‍යාව සහ ජාතික සහ ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සහ ආයතන සමග සහයෝගිතාව වැඩි කිරීම

(ii)පර්යේෂණ ප්‍රතිදානවල සංඛ්‍යාව වැඩි කිරීම.

**ඉලක්කය 6: ආයෝජන සහ විදෙස් සිසුන් ආකර්ෂණය කර ගැනීම සඳහා උසස් අධ්‍යාපනය පරිවර්තනය කිරීම**

**අරමුණු:**

**(i)විදේශ විශ්වවිද්‍යාල සමග ශිෂ්‍ය හුවමාරු වැඩසටහන.**

**(ii) විදේශ සිසුන් ඇතුළත් කර ගැනීම ක්‍රියාත්මක කිරීම.**

**ඉලක්කය 7: ආයෝජන සහ විදෙස් සිසුන් ආකර්ෂණය කර ගැනීම සඳහා උසස් අධ්‍යාපනය පරිවර්තනය කිරීම**

**අරමුණු:**

**(i) විද්‍යායතනයේ සාමාන්‍ය පරිපාලනය තුළ උපරිම කාර්යක්ෂමතාව ලබා ගැනීම සඳහා වැඩ කිරීමට කුසලතා වැඩි දියුණු කිරීම.**

**(ii) වැඩ පරිසරය වැඩි දියුණු කිරීම.**

**(iii) ඊ-කාර්ය පරිසරය භාවිත කිරීම.**

**(iv) IIM හි මූල්‍ය ශක්තිය සංවර්ධනය කිරීම**

**(v) උපරිම අයවැය ප්‍රතිපාදන ඵලදායීව උපයෝජනය.**

**(vi) පරිපාලන කාර්යයන් මනාව පෙළගැස්වීම.**

**ඉලක්කය 8: ජාතික සංවර්ධනය, සංහිඳියාව සහ සාමය උදෙසා දායකත්වය වැඩි දියුණු කිරීම**

**අරමුණු:**

(i). විද්‍යාර්ථීන් විසින් බාහිරයට සපයනු ලබන උපදේශන සංඛ්‍යාව වැඩි කිරීම.

(ii)ජාතික ඒකාබද්ධතාව අරමුණු කොටගෙන ශිෂ්‍යයන් සහ කාර්ය මණ්ඩල අතර අන්තර් පුද්ගල සම්බන්ධතා වැඩි දියුණු කිරීමට ඒකාබද්ධ අධ්‍යයන වැඩසටහන් සහ වෙනත් ක්‍රියාකාරකම් මූලාරම්භ කිරීම සහ පැවැත්වීම.

(iii)ජාතික ඒකාබද්ධතාව සඳහා වන ජාතික සංවර්ධන වැඩසටහන්වලට සහභාගී වීම.

(iv)ජාතික සෞඛ්‍ය අංශයට පහසුකම් සැපයීම.

## 4.3 උපාධි අපේක්ෂක සිසුන් බඳවා ගැනීම (31.12.2018 දිනට)




| බඳවා ගැනීම | අනුමත සංඛ්‍යා | | ආයුර්වේද | | | යුනානි | | |
|---|---|---|---|---|---|---|---|---|
| | AYU | UNA | පිරිමි | කාන්තා | මුළු ගණන | පිරිමි | කාන්තා | මුළු ගණන |
| **2016/17 (1වන වසර)** | 180 | 60 | 38 | 143 | **181** | 6 | 49 | **55** |
| **2015/16 (2වන වසර)** | 180 | 60 | 31 | 119 | **150** | 3 | 31 | **34** |
| **2014/15 (3වන වසර)** | 160 | 60 | 29 | 102 | **131** | 13 | 33 | **46** |
| **2013/14 (4වන වසර)** | 150 | 50 | 27 | 106 | **133** | 7 | 36 | **43** |
| **2012/13 (අවසන් වසර)** | 150 | 50 | 22 | 133 | **155** | 13 | 32 | **45** |
| **2011/12 (අවසන් වසර)** | 150 | 50 | 19 | 79 | **98** | 5 | 43 | **48** |
| **මුළු ගණන** | **970** | **330** | **166** | **682** | **848** | **47** | **224** | **271** |

**මුළු ශිෂ්‍යයන් සංඛ්‍යාව: 1119**

## පසුගිය වසර තුන තුළ උපාධිධාරී ප්‍රතිදානය

| උපාධිධාරි වසර | | | මුළු ගණන |
|---|---|---|---|
| | ආයුර්වේද | යුනානි | |
| 2018 | 93 | 26 | **119** |
| 2017 | 85 | 27 | **112** |
| 2016 | 79 | 23 | **102** |

## 4.4 ශිෂ්‍ය සුබසාධනය

### 4.4.1 මූල්‍ය සහාය

ශිෂ්‍යාධාර සහ මහපොළ ශිෂ්‍යත්ව ලෙස ශිෂ්‍යයන්ට මූල්‍ය සහාය ලබා දෙනු ලැබේ.

**(i)** <u>මහපොළ ශිෂ්‍යත්ව</u>

ශිෂ්‍යයකුට රු. 5000/- ක මාසික දීමනාවක් මහපොළ ශිෂ්‍යත්ව අරමුදලේ දායකත්වය සමගින් කුසලතා හෝ සාමාන්‍ය පදනම මත පිරිනමනු ලැබේ.

| වසර | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|
| **2016/2017 (1වන වසර)** | **71** |
| **2015/2016 (2වන වසර)** | **56** |
| **2014/2015 (3වන වසර)** | **65** |
| **2013/2014 (4වන වසර)** | **72** |
| **2012/2013 (අවසන් වසර)** | **77** |
| **2011/2012 (අවසන් වසර)** | **71** |
| **මුළු ගණන** | **412** |




**(ii) ශිෂ්‍යාධාර**

මාසික දීමනාව රු. 4000/- හෝ රු. 3900/- ශිෂ්‍යයකුට ගෙවන සම්පූර්ණ හෝ අර්ධ ශිෂ්‍යයත්වයක් ලෙස.

| වසර | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|
| **2016/2017 (1වන වසර)** | **111** |
| **2015/2016 (2වන වසර)** | **91** |
| **2014/2015 (3වන වසර)** | **78** |
| **2013/2014 (4වන වසර)** | **70** |
| **2012/2013 (4වන වසර)** | **92** |
| **2011/2012 (අවසන් වසර)** | **48** |
| **මුළු ගණන** | **490** |




### 4.4.2 ශිෂ්‍ය නේවාසිකාගාර

ප්‍රධාන නේවාසිකාගාර දෙකක් විද්‍යායතනයේ සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම් සැපයීමට පවත්වාගෙන යනු ලැබේ.

**කාන්තා නේවාසිකාගාරය - 2018.12.31**

| වසර | මොරගස්මුල්ල සහ අංක 12 කාන්තා නේවාසිකාගාරය | |
|---|---|---|
| | ආයුර්වේද | යුනානි |
| **1වන වසර (2016/2017)** | 100 | 39 |
| **2වන වසර (2015/2016)** | - | - |
| **3වන වසර (2014/2015)** | 3 | |
| **4වන වසර (2013/2014)** | 29 | 8 |
| **5වන වසර ( 2012/2013)** | 62 | 28 |
| **5වන වසර ( 2011/2012)** | 54 | 38 |
| **මුළු ගණන** | **248** | **113** |

**පිරිමි නේවාසිකාගාරය -2018.12.31**

| වසර | අංක 330 නේවාසිකාගාරය | |
|---|---|---|
| | ආයුර්වේද | යුනානි |
| **1වන වසර (2016/2017)** | 28 | 5 |
| **2වන වසර (2015/2016)** | 10 | 2 |
| **3වන වසර (2014/2015)** | 14 | 7 |
| **4වන වසර (2013/2014)** | 11 | 1 |
| **5වන වසර ( 2012/2013)** | 5 | 5 |
| **5වන වසර ( 2011/2012)** | 6 | 3 |
| මුළු ගණන | **74** | **23** |

## 4.5 ආයතනයේ ශිෂ්‍ය සංගම්

මෙම ආයතනයේ ශිෂ්‍ය සංගමය දේශීය වෛද්‍ය ශිෂ්‍ය කමිටුව ලෙස ක්‍රියාත්මක වේ. එය සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු නිලධාරි මණ්ඩලයකින් සමන්විත වේ. මෙම ශිෂ්‍ය කමිටුව යටතේ ප්‍රධාන අනු කමිටු තුනක් (03) ක්‍රියාත්මක වේ.

**i. කලා අනුකමිටුව**

කලා හා සංස්කෘතික කටයුතු, කලා උළෙල සංවිධානය කිරීම සහ සිසුන්ගේ කලා කටයුතු වර්ධනය සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම මෙමගින් සිදු කෙරේ.

**ii. ආයුර්වේද ව්‍යාප්ති අනුකමිටුව**

මේ යටතේ පාසල්වල ආයුර්වේදය පිළිබඳ වැඩසටහන් පැවැත්වීම, ජංගම සායන සහ ප්‍රජා සංවර්ධන වැඩ සටහන් පැවැත්වීම, කුකුස නමින් සංවාද වැඩසටහනක් පැවැත්වීම යනාදී ක්‍රියා සිදු කෙරේ.

**iii. ක්‍රීඩා අනුකමිටුව**

වාර්ෂික ක්‍රීඩා උත්සවය සහ අවුරුදු උත්සවය සංවිධානය කිරීම, නවක සිසුන්ගේ ක්‍රීඩා උළෙල පැවැත්වීම, විවිධ ක්‍රීඩා සඳහා සිසුන් යොමු කිරීම හා කාය වර්ධන මධ්‍යස්ථානය පවත්වාගෙන යාම මෙමගින් සිදු කෙරේ.

## 4.6 ආයුර්වේද ශික්ෂණ රෝහල

ආයුර්වේද ශික්ෂණ රෝහල දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර එය උපාධි අපේක්ෂකයන්ට සායනික පුහුණුව ලබා දීම සහ රෝගී ප්‍රතිකාර සේවය සඳහා වෙන් වී ඇත. රෝහල් අධ්‍යක්ෂවරයෙකු යටතේ පාලනය වන මෙය විද්‍යායතනයට මීටර් 100ක් පමණ දුරින් කෝට්ටේ පාරේ පිහිටා ඇත

මෙම සායනික කටයුතු සඳහා දේශීය වෛද්‍ය විද්‍යායතනයේ කාර්ය මණ්ඩලයද සහභාගි වන අතර ඒ අනුව සිසුන්ගේ ප්‍රායෝගික දැනුම වර්ධනය කිරීමට මෙන්ම ආයුර්වේද ශික්ෂණ රෝහලට පැමිණෙන රෝගීන්ට ප්‍රතිකාර කිරීමටද ඔවුන්ගේ දායකත්වය ලැබේ.

## 4.7 ත්‍යාග සහ රන් පදක්කම්:

**අන්තර් විශ්වවිද්‍යාල ක්‍රීඩා උත්සවය**

| ඉසව්ව | ලාභියා |
|---|---|
| රග්බි | W.P.R. සෙනෙවිරත්න |
| වොලිබෝල් | K.M. ඩිල්ෂාන් |

**කොළඹ විශ්වවිද්‍යාලය - වර්ණ ප්‍රදානය**

| ඉසව්ව | ලාභියා |
|---|---|
| රග්බි | W.P.R. සෙනෙවිරත්න |
| වොලිබෝල් | K.M. ඩිල්ෂාන් |
| ටයිකොන්ඩෝ | වී.විජයර්වන් මහතා / ඒ.එම්.ජී.එච්.ජේතිලක මෙනවිය |
| මේස පන්දු | බී.එම්. එම්.එස්.ජයතිලක මෙනවිය / එන්.යූ.ටී අනුරාධ මෙනවිය |

## 5. මූල්‍ය සහ ගිණුම්කරණ විස්තර

### 5.1 මූල්‍ය විශ්ලේෂණය

1. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

| විෂය | 2018 රු. | 2017 රු. |
|---|---|---|
| 1. පුද්ගල වේතන | 349,797,902 | 287,795,392 |
| 2. ගමන් වියදම් | 1,104,300 | 193,421 |
| 3. සැපයුම් | 8,965,857 | 9,488,088 |
| 4. නඩත්තු | 4,652,198 | 3,308,572 |
| 5. කොන්ත්‍රාත්තුමය සේවා | 37,539,926 | 32,060,477 |
| 6. වෙනත් | 13,312,276 | 12,315,181 |
| **මුළු ගණන** | **415,372,459** | **345,161,131** |

**11.** ප්‍රාග්ධන වියදම් විස්තර

| විෂය | 2018 | 2017 |
|---|---|---|
| අ. පුනරුත්ථාපන සහ වැඩි දියුණු කිරීම් | 15,208,945 | 27,439,371 |
| ආ. ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් | 14,398,545 | 9,478,721 |
| ඇ. මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘතිය | 1,816,074 | 2,862,093 |
| ඇ. ශක්තිමත් කිරීම සහ පර්යේෂණ | 4,586,728 | 6,933,989 |
| **මුළු ගණන** | **36010292** | **46,714,174** |

**111.** මූල්‍ය ප්‍රගතියේ විස්තර (වියදම්)

| විෂය | ප්‍රතිපාදන 2018 රු. | වියදම් 2018 රු. | ඉතුරුම්/අතිරික්ත ය රු. |
|---|---|---|---|
| අ. ව්‍යාපෘති හැර පුනරාවර්තන | 415,000,000 | 415,372,459 | (372,459) |
| ආ. ව්‍යාපෘති හැර ප්‍රාග්ධන | 50,000,000 | 36,010,292 | 13,989,708 |
| ඇ. ව්‍යාපෘති – දේශීය අරමුදල්කරණය කළ | - | - | - |
| ඇ. ව්‍යාපෘති – විදේශීය අරමුදල්කරණය කළ | - | - | - |
| | | | |
| **මුළු ගණන** | **465,000,000** | **451,382,751** | **14,362,167** |
| | | | |

**ප්‍රගති වාර්තාව 2018 QA Cell – IIM; පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී**

**i. Quality Assurance Cell ජාත්‍යන්තර මට්ටමින් ස්ථාපනය කරන ලද අතර-IQAC-IIM ආචාර්ය මහීස් සම්බන්ධීකාරක ලෙස පත් කරන ලදී.**

**ii. පහත දැක්වෙන පරිදි වසම් සම්බන්ධීකාරකවරුන් පත් කර ඇත**

**නිර්ණායකය 1** **-** <u>වැඩසටහන් කළමනාකරණය</u>

**සම්බන්ධීකාරක**

අධ්‍යක්ෂ

අංශාධිපති/ ආයුර්වේද

අංශාධිපති/ යුනානි

සම්බන්ධීකාරක

නියෝජ්‍ය ලේඛකාධිකාරි

නියෝජ්‍ය මූල්‍යාධිකාරි

ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති

**නිර්ණායකය 2** - **<u>මානව සහ භෞතික සම්පත්</u>**

**සම්බන්ධීකාරකවරුන්** - ආචාර්ය එස්.එම්.එස්. සමරකෝන්

- ආචාර්ය එම්.එස්.එම් නස්මීර්

**නිර්ණායකය 3** - **<u>වැඩසටහන් නිර්මාණය සහ සංවර්ධනය</u>**

**සම්බන්ධීකාරකවරුන්** - ආචාර්ය ඊ.ඩී.ටී.පී. ගුණරත්න

- ආචාර්ය එස්.එම්. රසුඩීන්

**නිර්ණායකය 4** - **<u>පාඨමාලා මොඩියුල නිර්මාණය සහ සංවර්ධනය</u>**

**සම්බන්ධීකාරකවරුන්** - ආචාර්ය කේ.ආර්. වීරසේකර

- ආචාර්ය එම්.එන්.එෆ්. රිස්නියා

**නිර්ණායකය 5** - **<u>ඉගැන්වීම සහ ඉගෙනුම</u>**

**සම්බන්ධීකාරකවරුන්** - ආචාර්ය. වයි.ඒ.යූ.ඩී. කරුණාරත්න

- ආචාර්ය ඒ.එච්.එම්. මව්ජූඩ්

**නිර්ණායකය 6** - **<u>ඉගෙනුම් පරිසරය, ශිෂ්‍ය සහාය සහ ප්‍රගතිය</u>**

**සම්බන්ධීකාරකවරුන්** - ආචාර්ය. පී.කේ. වැන්දබෝනා

- ආචාර්ය ඒ.එච්.ඒ. ෆසීනා

**නිර්ණායකය 7** - **<u>ශිෂ්‍ය ඇගයීම සහ සම්මාන</u>**

**සම්බන්ධීකාරකවරුන්** - ආචාර්ය. එල්.පී.ඒ. කරුණාතිලක

- ආචාර්ය එම්.අයි. මනූහා

**නිර්ණායකය 8** - **<u>නවෝත්පාදනීය සහ නිසි භාවිතා</u>**

**සම්බන්ධීකාරකවරුන්** - ආචාර්ය පී.කේ. පෙරේරා

- ආචාර්ය එම්.යූ.ඉසෙඩ්.එන්. ෆර්සානා

**iii. SLQF හා වෛද්‍ය විෂයමාලාවලට අනුකූල වන IIM විෂයමාලා සංශෝධන පිළිබඳ වැඩමුළුව (2018.05.21)**

**iv. අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ මෘදු කුසලතා සංවර්ධනය පිළිබඳ වැඩමුළුව පවත්වන ලදී. (2108.09.21)**

**v. පහත දැක්වෙන පරිදි SER රචකයන් පත් කරන ලදී**

**ආයුර්වේද අංශය –** ආචාර්ය බී.එම්.එස්. අමරජීව

ආචාර්ය ඩබ්.කේ.ඩී.එස්. ප්‍රනාන්දු

**යුනානි අංශය –** ආචාර්ය එම්.යූ.එස් ෆර්සානා

ආචාර්ය ඒ.එම්. මුතාලිබ්

# දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
# කොළඹ විශ්වවිද්‍යාලය

# 2015.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන

| අන්තර්ගතය | පිටුව |
|---|---|


**කොටස - I**

| | |
|---|---|
| 01 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | **1** |
| 02 මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය | **2** |
| 03 ශුද්ධ වත්කම්වල වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය | **3** |
| 04 මුදල් ප්‍රවාහ ප්‍රකාශය | **4** |

**කොටස -II**

| | |
|---|---|
| 05 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට සටහන් | **5 සිට 13** |
| 06 මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශයට සටහන් | **14 සහ 15** |
| 07 මුදල් ප්‍රවාහ ප්‍රකාශයට සටහන් | **16 සහ17** |
| 08 මූල්‍ය ප්‍රකාශවලට උපලේඛන (A සිට L) | **18 සිට 24** |
| 09 ශේෂ පිරික්සුම | **25-28** |
| 10 අයවැය වෙන් කිරීම | **29-30** |
| 11 ආයතනයෙහි ගිණුම්කරණ ප්‍රතිපත්තිය | **31-33** |

## දේශීය වෛද්‍ය විද්‍යායතනය-කොළඹ විශ්වවිද්‍යාලය
## 2018 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන් | 2018 | 2018 | | 2017 | 2017 |
|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | Rs. |
| **ජංගම වත්කම්** | | | | | | |
| මුදල් සහ මුදල් සමාන දේ | 1 | 15,380,602 | | | 18,123,026 | |
| ලැබිය යුතු දේ | 2 | 22,074,115 | | | 23,478,430 | |
| තොග | | 2,552,661 | | | 1,690,377 | |
| පෙර ගෙවීම් | 3 | 455,617 | | | 418,896 | |
| | | | 40,462,995 | | | 43,710,729 |
| **වත්කම්** | | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | | |
| ආයෝජන | 4 | 26,849,204 | | | 24,282,556 | |
| යටිතල පහසුකම්, පිරියත සහ උපකරණ | 5 | 92,510,052 | | | 100,393,363 | |
| ඉඩම් සහ ගොඩනැගිලි | 6 | 2,715,289,685 | | | 2,727,226,224 | |
| පොත්, වාර සඟරා සහ ක්‍රීඩා භාණ්ඩ | 7 | 10,418,616 | 2,845,067,557 | | 9,376,762 | 2,861,278,905 |
| නොනිමි වැඩ | 8 | 16,678,593 | 16,678,593 | | 4,290,382 | 4,290,382 |
| | | | 2,861,746,150 | | | 2,865,569,287 |
| **මුළු වත්කම්** | | | **2,902,209,145** | | | **2,909,280,016** |
| **වගකීම්** | | | | | | |
| **ජංගම වගකීම්** | | | | | | |
| ගෙවිය යුතු | 9 | #REF! | | | 9,520,894 | |
| විලම්බිත ආදායම | 10 | 70,598 | | | 70,598 | |
| උපචිත වියදම් | 11 | 17,961,067 | | | 15,071,576 | |
| විවිධ ණය හිමියන් | 12 | 12,363,611 | | | 1,170,519 | |
| | | | 41,082,247 | | | 25,833,587 |
| **ජංගම-නොවන වගකීම්** | | | | | | |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම | | 89,201,106 | | | 74,584,770 | |
| | | | 89,201,106 | | | 74,584,770 |
| **මුළු වගකීම්** | | | 130,283,353 | | | 100,418,357 |
| **මුළු ශුද්ධ වත්කම්** | | | **2,771,925,792** | | | **2,808,861,659** |
| **ශුද්ධ වත්කම් / හිමිකම්** | | | | | | |
| ප්‍රාග්ධන ප්‍රදාන - වැය කළ | 13 | 399,254,430 | | | 404,949,593 | |
| ප්‍රාග්ධන ප්‍රදාන - වැය නොකළ | | 7,788,661 | | | 12,798,953 | |
| පොදු සංචිතය | 14 | -151,500,293 | | | -139,205,832 | |
| සමුච්චිත අරමුදල | 15 | 2,516,382,994 | | | 2,530,318,945 | |
| | | | 2,771,925,792 | | | 2,808,861,659 |
| **මුළු ශුද්ධ වත්කම් / හිමිකම්** | | | **2,771,925,792** | | | **2,808,861,659** |

36 සිට 38 දක්වා පිටුවල ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 05 සිට 29 දක්වා පිටුවල ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය කොටසකි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා කළමනාකරණ මණ්ඩලය වග කිව යුතු වේ. මෙම මූල්‍ය ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

| | | | |
|---|---|---|---|
| මහාචාර්ය පී.ඒ. පරණගම<br>අධ්‍යක්ෂ | ආචාර්ය බී.එම්. නජීබ්<br>නිල බලයෙන් සාමාජික<br>කළමනාකාර මණ්ඩලය | එච්.එම්.ජී. පුංචිබණ්ඩා මයා<br>නියෝජ්‍ය මූල්‍යාධිකාරි | එම්.එල්. වර්ණසූරිය මයා<br>නියෝජ්‍ය ලේඛකාධිකාරි |

**දේශීය වෛද්‍ය විද්‍යායතනය-කොළඹ විශ්වවිද්‍යාලය**
**2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා**
**මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය**

| | සටහ | 2018 | 2017 |
|---|---|---|---|
| <u>මෙහෙයුම් ආදායම</u> | | රු. | රු. |
| පුනරාවර්තන ප්‍රදාන | | 415,000,000 | 339,681,000 |
| පුනරාවර්තන ස්වභාවයෙහි ප්‍රාග්ධන වියදම් | | 6,402,802 | 8,517,581 |
| රාජ්‍ය: ප්‍රදාන - මහපොළ භාරකාර අරමුදල | | 6,762,600 | 8,194,100 |
| රාජ්‍ය: ප්‍රදාන - මහපොළ- UGC | | 6,423,450 | 4,758,300 |
| රාජ්‍ය: ප්‍රදාන - ශිෂ්‍යාධාර- UGC | | 12,104,900 | 12,157,200 |
| වෙනත් ආදායම් | **16** | 8,502,914 | 11,403,583 |
| සම්මන්ත්‍රණ ආදායම් | **17** | 667,347 | 2,254,410 |
| ක්‍රමක්ෂය | | 36,056,296 | 32,951,408 |
| | | **491,920,309** | **419,917,582** |
| <u>මෙහෙයුම් වියදම්</u> | | | |
| සාමාන්‍ය පරිපාලනය | **18** | 141,113,294 | 122,426,911 |
| අධ්‍යයන සේවා | **19** | 276,113,983 | 228,567,688 |
| පුස්තකාලය සේවා | **20** | 18,806,959 | 15,507,644 |
| නේවාසිකාගාර | **21** | 4,704,244 | 4,600,088 |
| පශ්චාත් උපාධි වියදම්-ආයුර්වේද | | 0 | 16,833 |
| පශ්චාත් උපාධි වියදම්-යුනානි | | 0 | 40,096 |
| ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම් | | 50,076,028 | 46,971,140 |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් වැඩි වීම | | 17,493,187 | 10,030,396 |
| විගණන ගාස්තු | | 525,000 | 500,000 |
| පුනරාවර්තන ස්වභාවයෙහි ප්‍රාග්ධන වියදම් | | 6,402,802 | 8,517,581 |
| භෛසජ්ජ වියදම්-16/17 | | 650,250 | 655,000 |
| MD වියදම් 17/19 | | 132,016 | 240,000 |
| වියදම් - ආයුර්වේද සහ සාම්ප්‍රදායික වෛද්‍ය | | 800,000 | 5,513,180 |
| වියදම්-කුසලතා දියුණු කිරීම සහ කර්මාන්ත පුහුණුව | | 127,575 | 0 |
| වියදම් සම්බාහන චිකිත්සාව 2017 | | 390,000 | 0 |
| වියදම් සම්බාහන චිකිත්සාව 2018 | | 256,000 | 0 |
| වියදම් ඉලාජ් ජසඩීන් (කායික චිකිත්සාව) | | 53,666 | 0 |
| **මුළු මෙහෙයුම් වියදම්** | | **517,645,004** | **443,586,557** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් අතිරික්තය / (ඌනතාව)** | | **-25,724,695** | **-23,668,975** |

වැඩ බලන නියෝජ්‍ය මූල්‍යාධිකාරි
දේශීය වෛද්‍ය විද්‍යායතනය

**දේශීය වෛද්‍ය විද්‍යායතනය-කොළඹ විශ්වවිද්‍යාලය**
**2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා**
**ශුද්ධ වත්කම්වල වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය**

| | සටහ | පොදු | ප්‍රාග්ධන ප්‍රදාන | ප්‍රාග්ධන | ප්‍රත්‍යාගණන | සමුච්චිත | මුළු ගණන |
|---|---|---|---|---|---|---|---|
| | | සංචිතය | වැය කළ | වැය නොකළ | සංචිතය | අරමුදල | |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **-129,842,562** | **399,912,640** | **115,991,414** | **2,524,280,945** | **20,435,843** | **2,930,778,280** |
| ක්‍රමක්ෂය | | | -32,237,927 | | - 14,019,732 | -713,481 | **- 46,971,140** |
| වත්කම් අත්පත් කර ගැනීම | | | 146,792,461 | | | 97,172 | **146,889,633** |
| මොරගස්මුල්ල නව නේවාසිකාගාරය | | | -101,000,000 | | | | **- 101,000,000** |
| ලැබීම් | | | | 43,600,000 | | 19,798 | **43,619,798** |
| වියදම් | | | | -146,792,461 | 218,400 | | **- 146,574,061** |
| මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය තුළ හඳුනා නොගත් ශුද්ධ ලාභ සහ අලාභ | | 14,305,705 | | | | | **14,305,705** |
| කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය / (ඌනතාව) | | -23,668,975 | | | | | **- 23,668,975** |
| ප්‍රාග්ධන වියදම් පුනරාවර්තන ස්වභාවයේ | | | - 8,517,581 | | | | **- 8,517,581** |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **-139,205,832** | **404,949,593** | **12,798,953** | **2,510,479,613** | **19,839,332** | **2,808,861,659** |
| ක්‍රමක්ෂය | | | - 35,302,653 | | - 14,019,732 | - 753,642 | - 50,076,027 |
| වත්කම් අත්පත් කර ගැනීම | | | 36,010,292 | | | 24,760 | 36,035,052 |
| | | | | | | . | - |
| ලැබීම් | | | | 31,000,000 | | 812,663 | 31,812,663 |
| පෙර වසරේ ගැළපුම් | | | | | | | - |
| වියදම් | | | | - 36,010,292 | | | - 36,010,292 |
| මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය තුළ හඳුනා නොගත් ශුද්ධ ලාභ සහ අලාභ | | 13,430,234 | | | | | 13,430,234 |
| කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය / (ඌනතාව) | | - 25,724,695 | | | | | - 25,724,695 |
| ප්‍රාග්ධන වියදම් පුනරාවර්තන ස්වභාවයේ | | | - 6,402,802 | | | | - 6,402,802 |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **- 151,500,293** | **399,254,430** | **7,788,661** | **2,496,459,881** | **19,923,113** | **2,771,925,792** |

වැඩ බලන නියෝජ්‍ය මූල්‍යාධිකාරී
දේශීය වෛද්‍ය විද්‍යායතනය

## දේශීය වෛද්‍ය විද්‍යායතනය-කොළඹ විශ්වවිද්‍යාලය
## 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සටහන් | 2018 | | 2017 | |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | Rs. |
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින්</u> | | | | | |
| <u>මුදල් ප්‍රවාහය</u> | | | | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් අතිරික්තය / (ඌනතාව) | | -25,724,695 | | -23,668,975 | |
| ස්ථාවර තැන්පතු සහ ඉතුරුම් ගිණුම්වලින් පොලී | | -2,563,673 | | -2,499,993 | |
| ස්ථාවර වත්කම් විකිණීම | | | | | |
| මෙහෙයුම් අතිරික්තය / ඌනතාව | | -28,288,368 | | -26,168,968 | |
| <u>මුදල් නොවන චලන</u> | | | | | |
| වෙනත් ගැළපුම් | 22 | -153,416 | | 689,662 | |
| | | -6,402,802 | | | |
| ක්ෂය | | 50,076,028 | | 46,971,140 | |
| ක්‍රමක්ෂය | | -36,056,296 | | -32,951,408 | |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම | | 17,493,187 | | 10,030,396 | |
| <u>කාරක ප්‍රාග්නයෙහි වැඩි වීම/අඩු වීම</u> | | | | | |
| ලැබිය යුතු දේ වැඩි වීම/ අඩු වීම | 23 | 542,031 | | -597,904 | |
| විලම්බිත ආදායම වැඩි වීම/ අඩු වීම | | 0 | | -40,000 | |
| ගෙවිය යුතු දේ වැඩි වීම/ අඩු වීම | 24 | 1,166,077 | | 4,809,518 | |
| උපචිත වියදම් වැඩි වීම/ අඩු වීම | 25 | 2,889,491 | | 3,309,489 | |
| විවිධ ණය හිමියන් වැඩි වීම/ අඩු වීම | | 11,193,092 | | | |
| පෙර ගෙවීම් වැඩි වීම/ අඩු වීම | | -36,721 | | -88,606 | |
| ගෙවූ පාරිතෝෂික | | -2,876,851 | | -5,827,289 | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | | | 9,545,452 | | 136,030 |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින්</u> | | | | | |
| <u>මුදල් ප්‍රවාහය</u> | | | | | |
| ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම | | -34,278,975 | | -45,792,461 | |
| ස්ථාවර තැන්පතු සහ ඉතුරුම් ගිණුම්වලින් පොලී | | 2,566,648 | | 2,499,993 | |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන | | | | | |
| ඉතුරුම් ගිණුම්වල ආයෝජනය | | | | | |
| ස්ථාවර වත්කම් විකිණීම | | | | -101,000,000 | |
| නොනිමි වැඩ | | -12,388,212 | | -2,666,209 | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | | | - 44,100,539 | | -146,958,677 |
මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කර ඇති අතර ප්‍රකාශ කර ඇති අවස්ථා හැරුණු කොට මූල්‍ය වටිනාකම්වල වෙනස් වීම් සැලකිල්ලට ගෙන නොමැත. පිරිවැය වත්කම් සඳහා හුවමාරුවල දී ඇති සාධාරණ වටිනාකම මත පදනම් වේ.

(iii)කෘත්‍ය හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරනු ලබන අතර එය ආයතනයේ කෘත්‍ය හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වේ.

## 1.2 වත්කම් සහ ඒවායේ වටිනාකම සඳහා පදනම්

### 1.2.1 දේපළ, ගෘහභාණ්ඩ, පිරියත හා උපකරණ

ආයතනයේ ඉඩම සහ ගොඩනැගිලි, කාර්යාලය, විද්‍යාගාරය හා ඉගැන්වීම් උපකරණ, ගෘහභාණ්ඩ සහ සවි කිරීම් හා වාහන ප්‍රත්‍යාගණනය කර, 2016.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගිණුම්වල හඳුනා ගෙන ඇත. කාල සීමාව තුළ දී මිල දී ගෙන ඇති දේපළ, පිරියත හා උපකරණ සහ පුස්තකාල පොත් සහ කොන්ක්‍රීට් බංකු පිරිවැයට දක්වා ඇත.

ක්ෂය වීම් ප්‍රත්‍යාගණනය කළ වටිනාකම මත සහ මිල දී ගැනීමේ පිරිවැය මත මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශයට අය කර ඇත. පහත වාර්ෂික අනුපාත යොදා ගෙන ඇත.

| | |
|---|---|
| ගොඩනැගිලි | 5% |
| ගෘහ භාණ්ඩ සහ සවි කිරීම් | 10% |
| කාර්යාල විද්‍යාගාර සහ ඉගැන්වීම් උපකරණ | 20% |
| පරිගණක | 20% |
| මෝටර් වාහන | 20% |
| පුස්තකාල පොත් | 20% |
| ක්‍රීඩා උපකරණs | 20% |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | 20% |
| අර්ධ ස්ථාවර දේශන ශාලාව | 5% |
| කොන්ක්‍රීට් බංකු | 20% |

2018 වර්ෂය සඳහා ක්ෂය වීම් වෙනුවෙන් රු. මිලියන 50ක මුදලක් ලබා දී ඇත. එය රු. මිලියන 3කින් ස්ථාවර වත්කම්වලට කළ එක් කිරීම් හේතුවෙන් වැඩි වී ඇත.

සියලුම ස්ථාවර වත්කම්වල (රජයේ ප්‍රදානවලින් මිල දී ගත්, 2016.01.01 දිනට ප්‍රත්‍යාගණනය කළ, ත්‍යාග සහ පරිත්‍යාග ලෙස ලැබූ) ක්ෂයවීම් ක්‍රමක්ෂය කර ඇත.

යටිතල පහසුකම්, පිරියත සහ උපකරණ රු. මිලියන 7.8කින් ප්‍රධානවම සමුච්චිත ක්ෂය සහ ප්‍රත්‍යාගණනයට පසු පළමු වසර නිසා අඩු වී ඇත.

### 1.2.2 තොග

තොග පිරිවැය අනුව ගණනය කරනු ලැබේ.

2017 වසර තුළදී තොග වටිනාකම රු. මිලියන 0.9කින් වැඩි වී ඇත.

### 1.2.3 ලැබිය යුතු දේ සහ පෙර ගෙවීම්

ලැබිය යුතු දෑ ඒවා නිෂ්කාශණයට ඇස්තමේන්තු කළ මුදල අනුව දක්වනු ලැබේ

ලැබිය යුතු දේවල්ද රු. මිලියන 1.4කින් මද වශයෙන් වැඩි වී ඇත.

1.2.4 කෙටි කාලීන ආයෝජන
සමහර ආයෝජන එහි පොලිය සමග නැවත අලුත් කර ඇත.

ස්ථාවර තැන්පතුව පොලිය නැවත ආයෝජනය කිරීම නිසා ආයෝජන රු. මිලියන 2.5කින් වැඩි වී ඇත.

1.3 වගකීම් හා ප්‍රතිපාදන

2017.12.31 වන දිනට සියලුම දන්නා වගකීම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබෙන අතර දන්නා නමුත් මුදල නිවැරදිව තීරණය කළ නොහැකි වගකීම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ඇත.

ඉල්ලුම මත ගෙවිය යුතු බැඳීම් හෝ වසරක් තුළ ගෙවිය යුතු බැඳීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම වගකීම් ලෙස දක්වා ඇත. වසරකට පසුව ගෙවිය යුතු වගකීම් මූල්‍ය තත්ත්වය තුළ ජංගම-නොවන වගකීම් ලෙස දක්වා ඇත.

2017.12.31වන දිනට ආයතනයට එරෙහිව අධිකරණ නඩු කටයුතු හතරක් තිබෙන අතර එම නඩුකර සඳහා වැයවෙන බවට ඇස්තමේන්තු කළ මුදල රු. මිලියන 0.69කි.

1.3.1 ප්‍රදාන සඳහා ගිණුම්කරණය

ආයතනය විසින් වියදම් සඳහා දැරූ මුදල් සඳහා වූ වන්දි පූරණය කරන ප්‍රදාන වියදම් හඳුනා ගෙන ඇති කාල සීමාව තුළදීම මූල්‍ය  කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශයේ ආදායම ලෙස හඳුනා ගෙන ඇත. වත්කම්වල පිරිවැය සඳහා ආයතනයට වන්දි පූරණය කරන ප්‍රදාන අදාළ වත්කමේ ප්‍රයෝජනවත් කාල සීමාව සඳහා ක්‍රමානුකූල පදනම මත මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශයේ හඳුනා ගෙන ඇත.

1.3.2 සේවක ප්‍රතිලාභ

සාමාන්‍යයෙන් වයස, සේවා කාලය හා වන්දි ආදී සාධක මත විශ්‍රාම යාමේ දී සේවකයෙකුට ලැබෙන ප්‍රතිලාභ ප්‍රමාණය සඳහා ප්‍රතිලාභ සැලසුමක් නිර්ණය කරන ලදී.

නිර්ණය කළ ප්‍රතිලාභ සැලසුම් සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්වය තුළ හඳුනා ගත් වගකීම 2019.12.31 දිනට ඇති බැඳීමේ වර්තමාන වටිනාකම වේ.

1.4 ආදායම හඳුනා ගැනීම

ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා යන පරිදි ආදායම හඳුනා ගැනේ.

2018 වසර සඳහා පුනරාවර්තන වියදම් සඳහා වූ මුළු රජයේ ප්‍රදානය රු. මිලියන 415ක් විය.

1.5 වියදම්

වියදම් දැරූ පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතම අතර සෘජු සම්බන්ධතාව මත පදනම්ව මූල්‍ය කාර්ය සාධනය තුළ හඳුනා ගනු ලැබේ. ආයතනය පවත්වා ගෙන යාමේ දී සහ ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමේ දී දැරූ සියලුම විදයම් වසර සඳහා අතිරික්තය/ හිඟය අනුව ආදායමට එකතු කර ඇත.

1.6 සංසන්දනාත්මක තොරතුරු

හැකි සෑම විටම සෑම ප්‍රකාශයකම සංසන්දනාත්මක සංඛ්‍යා දක්වා ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No.: ඊඩියු/බී/අයිඅයිඑම්/එෆ්ඒ/2018 ඔබේ අංකය / உமது இல. / Your No.: දිනය / திகதி / Date: 2019 මැයි 16 දින

අධ්‍යක්ෂ
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය

**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාවේ කෙටුම්පත මේ සමඟ එවා ඇත.

02. එම වාර්තාවේ සාවද්‍ය හෝ එකඟවිය නොහැකි හෝ ප්‍රසිද්ධ කිරීම මහජන යහපතට පටහැනි වන්නේ යැයි අදහස් කරන කරුණු කිසිවක් වේ නම් මෙම ලිපියේ දින සිට දින 7 ක් ඇතුළත මා වෙත දැන්වීමට කටයුතු කළ යුතු අතර, මෙම කරුණු පිළිබඳ තවදුරටත් ඔබ සාකච්ඡා කිරීමට අදහස් කරන්නේ නම් ඒ බව දින 3 ක් ඇතුළත මා වෙත දන්වන්නේ නම් මැනවි.

03. ඉහත සඳහන් පරිදි දින හතක් ඇතුළත ඔබෙන් පිළිතුරක් නොලදහොත් කෙටුම්පත් වාර්තාවේ සඳහන් කරුණුවලට ඔබ එකඟ වූ ලෙස සලකා එම වාර්තාව පදනම් කරගෙන අවසාන වාර්තාව නිකුත් කරනු ලබන බව කරුණාවෙන් සලකන්න.

එස්.ටී.බී. රත්නායක
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :
1. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
2. උපකුලපති - කොළඹ විශ්වවිද්‍යාලය
3. ලේකම් - නගර සැලසුම්,ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. ලේකම් - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව  இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.  No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34  +94 11 2 88 72 23  ag@auditorgeneral.gov.lk  www.naosl.gov.lk

"කෙටුම්පත"

"රහසිගතයි"

ඊඩියු/බී/අයිඅයිඑම්/එෆ්ජී/2018 2019 මැයි දින

අධ්‍යක්ෂ
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය

**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.2 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යා ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විද්‍යා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම,
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. ගිණුම්

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

#### 2.1.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 2

(අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදි ක්‍රියාකාරකම් නිශ්චිතව හඳුනාගෙන ගිණුම් කාලපරිච්ඡේදයට අදාළ මූල්‍ය චලනයන් පමණක් සැලකිල්ලට ගත යුතු වුවද පහත දැක්වෙන කරුණු අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය නිවැරදිව පිළියෙල කර නොතිබූ අතර ඒ අනුව එම ප්‍රකාශනය තුළනය කිරීම පිළිබඳ විගණනයේදි සෑහීමකට පත්වීමට නොහැකි විය.

(i) ප්‍රාග්ධන මුදල් පොතට අනුව 2018 වර්ෂයට අදාළ ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා දරන ලද වියදම රු.29,607,490 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි රු.34,728,975 ක් ලෙස දක්වා තිබූ අතර කෙරීගෙන යන වැඩ ලෙස රු.12,388,212 ක මුදල් ගලායාමක් පවතින බවට දක්වා තිබීම හේතුවෙන් ආයෝජන මුදල් ප්‍රවාහය රු.17,509,697 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ii) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය දැක්වීමේදී සමුච්චිත අරමුදල යටතේ අරමුදල් වැඩිවීම රු.703,553 ක් විය යුතු වුවත් එය රු.812,663 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනිතවූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.109,110 කින් වැඩියෙන් දක්වා තිබුණි.

**2.1.2** අනෙකුත් ගිණුම්කරණ අඩුපාඩු

-----------------------------------

විස්තර පහත පරිදි විය.

(අ) විවිධ අත්තිකාරම් ගිණුමේ අවසාන ශේෂය රු.38,189 ක් විය යුතු වුවද එය මූල්‍ය ප්‍රකාශනවල රු. 24,241 ක් ලෙස ගෙන තිබුණි.

(ආ) 2018 දෙසැම්බර් 31 දිනට මුදලින් ලද නේවාසිකාගාර ගාස්තු රු.395,300 ක් වූ ආදායම් මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි.

(ඇ) බැහැර දෙන ලද පුස්තකාල පොත් ආපසු ගෙනවිත් භාරදීමට ප්‍රමාදවීම මත 2019 ජනවාරි '19 වන දින වන විට රු.10,803 ක දඩ මුදලක් ගෙවීමට අදාල ලේඛනය අනුව නියම කර තිබූ නමුත් එම මුදල ලැබිය යුතු අයිතමයන් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව රු.6,936,708 ක් වූ කාර්යාල උපකරණ අත්පත් කර ගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කළ මෘදු පිටපතෙහි රු.6,918,533 ක් ලෙස රු.18,175 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) ආයතනය විසින් 2016 ජනවාරි 01 දින සිදුකරන ලද වත්කම් ප්‍රත්‍යාගණන අවස්ථාවේදී වත්කම් අගය කිරීමේ වාර්තාවල එම වත්කම් භෞතිකව නිරීක්ෂණය නොවූ බව සඳහන් කරමින් රු.2,491,050 ක් වටිනා වත්කම් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් අගය කර නොතිබුණි. මේ හේතුවෙන් එම වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබූ බව පසුගිය විගණන වාර්ථාවෙන් පෙන්වා දෙන ලද නමුත් සමාලෝචිත වර්ෂයේදී එම වෙනස හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

4

## 2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

විස්තර පහත පරිදි විය .

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මූල්‍ය අනුග්‍රහය මත පශ්චාත් උපාධි පුහුණුවක් සඳහා විදේශගත වූ කථිකාචාර්යවරයෙකුගේ ගුවන් ටිකට්පත් ගාස්තු ලෙස 2012 වර්ෂයේ දී ආයතනයෙන් ගෙවන ලද රු. 79,000 ක් 2018 වර්ෂය දක්වාම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් අයකරගෙන නොතිබුණි.

(ආ) විදේශීය ප්‍රකාශකයන්ගෙන් ප්‍රකාශන මිලදී ගැනීමේදී සේවාව ලබාගැනීමට පෙර ආයතනය විසින් මුදල් ගෙවීම කරනු ලබන අතර එලෙස ප්‍රකාශන මිලදී ගැනීම සඳහා 2018 දෙසැම්බර් 31 දින වනවිට නිදහස් කර තිබූ මුදල රු.3,937,832 ක් වූ අතර ඒ තුළ වර්ෂ 1 සිට වර්ෂ 5 දක්වා පැරණි රු.1,800,738 ක් වූ ණය ශේෂයන් පැවතුණි.

## 2.3 ලිඛිත නීති රීති හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධානවලට අනුකූල නොවීම්

ප්‍රමාණාත්මක අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති රීති, රෙගුලාසි හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධිවිධානවලට යොමුව | විස්තරය |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 110 | අලාභ හානි සම්බන්ධයෙන් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

5

| | |
|---|---|
| (ii) මුදල් රෙගුලාසි 371 | අත්තිකාරම් වශයෙන් ලබාගත් මුදල් අදාළ කාර්යය අවසාන වූ වහාම පියවිය යුතු වුවත් අවස්ථා 10 කදී ලබාදී තිබූ මුළු මුදලම භාවිතා කිරීමකින් තොරව කාල ප්‍රමාදයක් සහිතව නැවත පියවීම්කර තිබුණි. |
| (ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.2 හා 4.2.6 වගන්ති | යුනානි, ආයුර්වේද හා පශ්චාද් උපාධි අංශවල ආංශික කාර්යසාධනය කළමණාකරණ මණ්ඩලය විසින් ඇගයීමට ලක් කර තිබුණද කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික කාර්යසාධන වාර්තා රේඛීය අමාත්‍යාංශයට සහ භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය 3 වන උපලේඛනය | ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් චක්‍රලේඛනයෙන් අපේක්ෂිත පරිදිම ඒවායේ වාර්තා තබා ගැනීමට සෑම ප්‍රයත්නයක්ම ගත යුතු වුවත් ස්ථාවර වත්කම් ලේඛනයෙහි සමුච්චිත ක්ෂයවීම් දැක්වෙන ආකාරයෙන් ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන ගොස් නොතිබුණි. |

## 2.4 මෙහෙයුම් සමාලෝචනය

### 2.4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පසුගිය වසර 7 තුළදී ආයතනයේ සිසුන් බඳවාගැනීම පිළිබඳ පරීක්ෂා කිරීමේදී විශ්වවිද්‍යාලයේ පවතින සම්පත් අනුව බඳවාගැනීමට පහසුකම් තිබුණු සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව 1,580 ක් වුවද මෙම කාල පරිච්ඡේදයේදී බඳවාගෙන තිබූ ශිෂ්‍ය සංඛ්‍යාව 1,475 ක් පමණි. එනම් බඳවා ගැනීමට හැකියාව ඇති මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 93.4 කි.

(ආ) අධ්‍යයන වර්ෂ 7 කට අදාල විභාග ප්‍රතිඵල පරීක්ෂා කිරීමේදී විභාග සඳහා පෙනී සිටි සිසුන්ගෙන් විභාග අසමත් වීමේ ප්‍රතිශතය, සිසුන්ගේ යෝග්‍යතාවය සමග වර්ධනය වී තිබුණු අතර විස්තර පහත දැක්වේ.

6

(i) 2010/2011 සිට 2016/2017 අධ්‍යයන වර්ෂය දක්වා අධ්‍යයන වර්ෂ 7 කට අදාල සිසුන් සඳහා 2018 වර්ෂය තුළ නියමිත විභාග වාර 25 ක් පවත්වා තිබූ අතර එම විභාග සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් අසමත් වීමේ ප්‍රතිශතය ආයුර්වේද වෛද්‍ය උපාධිය සහ යුනානි වෛද්‍ය උපාධිය සඳහා පිළිවෙලින් සියයට 44 ක් සහ 35 ක් විය.

(ඇ) ආයුර්වේද හා යුනානි පාඨමාලාවල පසුගිය අධ්‍යයන වර්ෂ 6 ට අදාළ සිසුන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විට පිළිවෙලින් සිසුන් 94 ක් හා සිසුන් 39 ක් පාඨමාලාව හැරගොස් තිබුණි. මෙය පසුගිය වසරට සාපේක්ෂව පිළිවෙලින් සියයට 14 ක් හා සියයට 15 ක අයහපත් වර්ධනයක් විය.

**2.4.2** කළමනාකරණ අකාර්යක්ෂමතා

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2018 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා චක්‍රලේඛයේ 3.1.6 ඡේදය ප්‍රකාරව 2019 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ආයතනය විසින් ආයතනයෙහි අංශ 6 කට අදාළව එම වාර්තා 2019 මැයි 10 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබූ අතර 2018 වර්ෂයට අදාල සමීක්ෂණ සිදුකර තිබූ අංශවලට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) වත්කම් සමීක්ෂණ වාර්තාව අනුව 2018 දෙසැම්බර් 31 දිනට වත්කම් ඒකක 44 ක් බඩු වට්ටෝරු පොතේ ලේඛනගත කර නොතිබූ බව හා වත්කම් ඒකක 96 ක් ඌණව පැවති බව නිරීක්ෂණය විය.

(ඇ) 2016 වර්ෂය වනවිට සායනික පර්යේෂණයක් සිදුකිරීම සඳහා අනුමැතිය ලබාදීමට දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ ආචාර ධර්ම කමිටුවට අයිකාරී බලයක් නොමැති වුවද එම කමිටුවේ අනුමැතිය මත ආයුර්වේද ශික්ෂණ රෝහලෙහි රෝගීන්ට ඖෂධ ලබාදීම මගින් කැස්ස පැණියක් සම්බන්ධයෙන් සායනික පරීක්ෂාවක් සිදුකිරීම සඳහා දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ ආචාර ධර්ම කමිටුව අනුමැතිය ලබා දී තිබුණි.

(ඈ) ඉහත කරුණට අදාල කථිකාචාර්යවරු දෙදෙනා දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ ආචාර ධර්ම කමිටුවේ සභාපති හා ලේකම් තනතුරු දරනු ලබන ලද කාලපරිච්ඡේදය තුළදී ඔවුන් දෙදෙනාද සහභාගී වූ පර්යේෂණය සඳහා අනුමැතිය ලබාගෙන තිබූ අතර ඉන් එක් කථිකාචාර්යවරයකු කැස්ස පැණිය ගෙන්වා බෙදාහරින සමාගමේ උපදේශකවරයකුද ලෙස කටයුතු කරයි.

(ඉ) පිළිවෙලින් රු.86,130 ක් සහ රු.15,500 ක් වටිනා ශීතකරණයක් සහ මයික්‍රොවේව් අවන් එකක් පොදු පරිහරණය සඳහා 2018 සැප්තැම්බර් 19 වන දින මිලදී ගෙන තිබුණද 2019 ජනවාරි 14 විගණිත දිනය වන විටත් එම උපකරණ භාවිතා නොකොට නිෂ්කාර්යව පැවතුණි.

(ඊ) දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යනාංශයට අනුයුක්තව පවත්වාගෙන යමින් තිබූ එම්.ඩී.(ආයුර්වේද) (2016/2019 ) වසර 3 ක පාඨමාලාවෙහි අධ්‍යන කටයුතු සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. 2017 දෙසැම්බර් 31 වන විට සිසුන් 32 දෙනකු පාඨමාලාවේ ලියාපදිංචිවී සිටි නමුත් වර්තමානය වන විට සිසුන් 15 දෙනකු පාඨමාලාව හැරගොස් ඇති අතර පාඨමාලාවට ලියාපදිංචි වූ සිසුන්ගෙන් රු. 1,945,000 ක මුදලක් ලැබී තිබුණු අතර එක් සිසුවෙකු රු. 850,000 ක් වූ සම්පූර්ණ පාඨමාලා ගාස්තුවම ගෙවා තිබුණි. 2018 දෙසැම්බර් 31 දිනට පාඨමාලාව සඳහා ගෙවිය යුතු ලෙස රු.4,435,944 ක මුදලක් සහ ලැබිය යුතු ආදායම් ලෙස රු.3,800,000 ක් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනවිත් තිබුණි.තවද මෙ සම්බන්ධයෙන් පැනනැගිය හැකි අසම්භාව්‍ය තත්ත්වයන් සැලකිල්ලට ගෙන මෙම කරුණ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

### 2.4.3 අධිකාරි බලය නොලත් ගනුදෙණු

---

2006 දෙසැම්බර් 22 දිනැති අංක පී.එෆ්./423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 වගන්තිය ප්‍රකාරව විශේෂිතම අවස්ථාවලදී හැර අරමුදල් ඇති කිරීමට මහා භාණ්ඩාගාරය ප්‍රතිපත්තියක් වශයෙන් ඉඩ නොදෙන අතර එසේ ක්‍රියාත්මක කරනු ලබන අරමුදල්ද රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් අදාළ වන ව්‍යවස්ථාමය රාමුව තුළ ක්‍රියාත්මක විය හැකි පරිදි ප්‍රතිපාදන සලසා තිබිය යුතු වේ. ආයතනය සේවක සුබසාධක අරමුදලක් ස්ථාපිත කර තිබූ නමුත් ඒ සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 2.4.4 ප්‍රසම්පාදන කටයුතු

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1.(ආ) ඡේදය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු, ප්‍රධාන ප්‍රසම්පාදන සැලසුමෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවද, ආයතනය ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයට අදාළව පිළියෙල කර තිබූ විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මෙහි ආයතනයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ කාල වකවානු දක්වා තිබුණද ආයතනය තුළ සිදු කරනු ලබන ප්‍රසම්පාදන ක්‍රියාවලිය පරීක්ෂා කිරීමේදී සැලසුම් කරන ලද කාල වකවානු අනුව සිදුකර නොමැති බව නිරීක්ෂණය විය.

(iii) පසුගිය වර්ෂයට අදාළ ඉටු නොවී පවතින ප්‍රසම්පාදනයන් ප්‍රසම්පාදන සැලැස්ම තුළ අවිච්ඡින්න වැඩ ලෙස දක්වා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රසම්පාදනය තුළින් අපේක්ෂිත ඉලක්ක හා අවිච්ඡින්න තත්ත්වය වෙන වෙනම හඳුනාගත නොහැකි විය.

(ආ) ප්‍රාග්ධන වත්කම් පුනරුත්තාපනය සහ වැඩිදියුණු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති 09 ක් වෙනුවෙන් රු. 16,910,425 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර ප්‍රාග්ධන වත්කම් පුනරුත්තාපනය සහ වැඩිදියුණු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ රු.15,208,945 ක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී දරන ලද වියදමින් රු.9,471,101 ක් 2017 වර්ෂයට අදාළ ව්‍යාපෘති සඳහා වැය කර තිබූ බව නිරීක්ෂණය විය.

## 2.4.5 අරමුදල් උපයෝජනය

---

ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රකාරව මිලදී ගැනීම් සිදු නොකිරීම හේතුවෙන් ලබාදෙන ලද රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ 2018 ජනවාරි 01 දිනට රු. 12,798,953 ක ශේෂයක් විය. සමාලෝචිත වර්ෂය සඳහා රු.31,000,000 ක ප්‍රාග්ධන ප්‍රදාන ලැබී තිබුණු අතර වත්කම් අත්පත් කර ගැනීම සඳහා වර්ෂය තුළ රු.36,010,292 ක මුදලක් වැය කිරීමෙන් පසු 2018 දෙසැම්බර් 31 දිනට උපයෝජනය නොකරන ලද මුදල රු.7,788,661 ක් විය.

## 2.4.6 මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කිරීම

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සමග කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2018 වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

## 2.4.7 ක්‍රියාකාරී සැලැස්ම

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ උපදෙස් පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළට අන්තර්ගත විය යුතු සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය, දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳව, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම, අයවැය ලේඛණය, ප්‍රසම්පාදන සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කිරීමේදී ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් ආයතනයේ ඉලක්ක හා අරමුණු ළඟාවීම් මැන බැලීමට නොහැකි විය.

3 අයවැය පාලනය

-----------------

අයවැයගත ආදායම් වියදම් සහ තත්‍ය ආදායම් වියදම් පරීක්ෂා කිරීමේදී සියයට 10 සිට 49 දක්වා වූ විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය සාර්ථක කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

4 තිරසාර සංවර්ධනය

--------------------

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" පිළිබඳව ආයතනය විසින් දැනුවත් වී තිබුණ නමුත් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළගා විය යුතු සංධිස්ථානයන් ද ඉලක්ක මත ළගාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

5 පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරිය වෙත යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | අත්තිකාරම් ලේඛන පවත්වාගෙන යාම | i | විදේශීය වාර සහරා සඳහා වන අත්තිකාරම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| | | ii | විවිධ අත්තිකාරම් ලබාදීම සඳහා වන අත්තිකාරම් ලේඛනය අනුව සහ අවසන් ගිණුම් අනුව ශේෂය අතර වෙනස්කම් නිරීක්ෂණය විය. |

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය
INSTITUTE OF INDIGENOUS MEDICINE
UNIVERSITY OF COLOMBO

රාජගිරිය ශ්‍රී ලංකාව
Rajagiriy Sri Lanka

දුරකථන - (Telephone (General) : 2694308, 692385
අධ්‍යක්ෂ - (Director):2861399,2697175,ෆැක්ස් (Fax):2888213
නියෝජ්‍ය ලේඛකාධිකාරී ( Deputy Registrar): 2697772
නියෝජ්‍ය මූල්‍යාධිකාරී (DeputyBursar) : 2689153
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී - (Sen.Asst.Regi).:5679709

My No: IIM/AR/2018 Your No: EDU/IIM/FA/2018 Date: 24.05.2019

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
නො. 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව විගණනාධිපති කෙටුම්පත් වාර්තාව

ඔබගේ උක්ත අංක EDU/IIM/FA/2018 දරණ 2019/05/16 දිනැති යථෝක්ත කෙටුම්පත් විගණකාධිපති වාර්තාවට අදාල පිළිතුරු පහතින් ඉදිරිපත් කරමි.

2. ගිණුම

2.1 ගිණුම්කරණ අඩුපාඩු

2.1.1. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 2

(ආ) විගණනය විසින් පෙන්වා ඇති පරිදි ආයෝජන මුදල් ප්‍රවාහය රු.17,509,697.00 කින් වැඩියෙන් දැක්වීමක් සිදු වී නොමැත. ප්‍රාග්ධන මුදල් පොතට අනුව ගෙවීම් සහ ලැබීම් නිවැරදිව සටහන් කර ඇත. ඒ අනුව ප්‍රාග්ධන මුදල් පොතේ ශේෂය හා වැය නොවූ මූලධන ගිණුමේ ශේෂය සමානව ඇත. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීමේ වියදම් ලෙස රු. 34,728,212.00ක් නොව රු.34,278,975.00 වේ. 2018 වර්ෂයේ සම්පූර්ණ ප්‍රාග්ධන වියදමෙන් පුනරාවර්තන ස්වරූපයේ ප්‍රාග්ධන වියදම් අඩුකල පසු ඉතිරිය වන රු.29,607,490.00කට උපචිත ප්‍රාග්ධන වියදමේ වටිනාකම වන රු.4,906,355.00ක මුදල එකතු කර ප්‍රාග්ධන වියදම සඳහා වූ අත්තිකාරම් ශේෂය වන රු. 234,870ක මුදල අඩුකර ඇත. තවද කෙරිගෙන යන වැඩ ගිණුමට රු.12,388,212ක මුදලක් ගෙවීම් කිරිම නොව පසුගිය වසරේ හා මෙම වසරේ කෙරිගෙන යන ගිණුම් අතර වෙනස පෙන්වා ඇත. තවද රු. 4,906,388ක මුදල ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම යටතේ පෙන්වා ඇත්තේ කාරක ප්‍රාග්ධන වෙනස් වීම්වල විවිධ ණයගැතියන් යටතේ අදාල මුදල අන්තර්ගත වීම හේතුවෙනි.

(ii) මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් හි වටිනාකම දැක්වීමේදී 812,663ක් ලෙස නිවැරදිව දක්වා ඇත.

### 2.1.2 අනෙකුත් ගිණුම්කරණ අඩුපාඩු

(ආ) ශේෂ පත්‍රයට අනුව විවිධ අත්තිකාරම් ගිණුමේ අවසන් ශේෂය රු. 24,241.01ක් වේ. විවිධ අත්තිකාරම් උප ලේඛණය අනුව ශේෂය රු. 25,211.00ක් වේ. විගණනය විසින් පෙන්වා ඇති රු.38,189ක් නිවැරදි නොවේ.

නේවාසික සිසුන්ගේ ඇති විචලතාවය අනුව උපචිත හා කලින් ලැබීම් නිශ්චය කල නොහැක. එබැවින් ලද මුදල් පමණක් අදායම් ලෙස ගිණුම් තබා ඇත.

(ආ) පුස්තකාලය වෙතින් තොරතුරු නොලැබීම මත මෙම තත්වය ඇති වී ඇත. ඉදිරියේදී මෙවැනි අඩුපාඩු අවම කර ගැනිමට කටයුතු කරනු ලැබේ.

(ඇ) කාර්යාල උපකරණ අත්පත් කර ගැනීම රු 6,918,533ක් වන අතර රු.18,175 ක වටිනාකම පසුගිය වර්ෂයේ මිලදී ගෙන ඇති අතර හරකර තිබුනේ ලී බඩු ගිණුම වේ.

(ඈ) එම මුදල නිවැරදි කිරිම සිදුකර ඇති නිසා වර්ෂයේ මිලදී ගැනීම්වලට වඩා රු.18,175කින් වැඩියෙන් දක්වා ඇත.

(ඉ) මෙම විමසුම සම්බන්ධව පැහැදිලි කිරිමක් 2018/11/07 දිනැති අංක EDU/IIM/FA/2018 ලිපිය මගින් ඉදිරිපත් කර ඇත.

### 2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) අදාල මුදල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ගෙන්වා ගැනීමට කටයුතු කරමින් සිටියි.

(ආ) විදේශීය සඟරා මිලදී ගැනිම සඳහා සඟරා මුද්‍රණ වර්ෂයට පෙර මුදල් ගෙවීම් සිදු කරනු ලබයි. එහෙත් සඟරා ලැබීම මුදල් ගෙවූ වර්ෂයට පසුව එලඹෙන වසරේදී ම නොලැබෙන අතර ඊට පසු වර්ෂ වලදී ද ලැබෙනු ඇත. විගණනය විසින් පෙන්වා ඇති රු. 1,800,738 ක් ණය ශේෂ රු. 1,615,057.39 ක් විය යුතු අතර එහි සාරාංශය පහත පරිදි වේ.

| මුදල් ගෙවූ වර්ෂය | සඟරා ලැබිය යුතු වර්ෂය | 2018/12/31 දිනට ශේෂය |
|---|---|---|
| 2013 | 2014 | 10,490.53 |
| 2014 | 2015 | 8,036.57 |
| 2015 | 2016 | 81,732.14 |
| 2016 | 2017 | 356,245.72 |
| 2017 | 2018 | 1,158,480.45 |
| | | **1,614,985.42** |

| | | |
|---|---|---|
| ඒ අනුව වසර 5කට වඩා පැරණි ශේෂය | රු. | 10,490.53 |
| වසර 4කට වඩා පැරණි ශේෂය | රු. | 8,036.57 |
| වසර 3කට වඩා පැරණි ශේෂය | රු. | 81,732.14 |
| වසර 2කට වඩා පැරණි ශේෂය | රු. | 356,245.72 |
| වසර 1කට වඩා පැරණි ශේෂය | රු. | 1,158,480.45 |
| | | 1,614,985.42 |

**2.3** ලිඛිත නිතීරිති පොත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කරන ලද

වෙනත් පොදු හෝ විශේෂ විධිවිධානවලට අනුකූල නොවීම.

(අ) **(i)** හානි සම්බන්ධ ලේඛණයක් පවත්වාගෙන යනු ලබයි.

(ii) විවිධ හේතු මත අදාල කාර්යයන් කල් දැමීම මත ලබාගත් අත්තිකාරම් මුදල් මුළු මුදලම භාවිතයකින් තොරව ආපසු ලබා දී ඇත. ඉදිරියේ ප්‍රමාදයන්ගෙන් තොරව මුදල් ආපසු ගෙවීමට උපදෙස් ලබා දෙන ලදී.

(ආ) ආයුර්වේද හා යුනානි අංශයන්හි 2018 වර්ෂයට අදාල වාර්තා යැවීමට කටයුතු කරන අතර ඉදිරියේ දී නියමිත කාල පාරාසය තුළ අදාල වාර්තා යැවීමට පියවර ගනු ඇත.

(ඇ) ස්ථාවර වත්කම් ලේඛණයේ ක්ෂය වීම් සඳහන්ව ඇත. එහි ඇති අඩුපාඩු සම්බන්ධව අදාල මෘදුකාංගය මිලදී ගත් ආයතනය සමඟ සාකච්ඡා කරමින් සිටියි. ඒ අනුව එම තත්වය නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ඇත.

**2.4 මෙහෙයුම් සමාලෝචනය**

**2.4.1. කාර්ය සාධනය**

(අ) සිසුන් බඳවා ගැනීමේදී ආයතනය විසින් කිසිදු අඩු කිරිමක් සිදු කර නොමැත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් එවන ලද නාමලේඛණය අනුව ලියාපදිංචි කරනු ලබන අතර ලියාපදිංචි නොවූ නාමලේඛණ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යවනු ලැබේ. ඒ අනුව නව නාමලේඛණය එවනු ලබන අතර ඒ අනුව ලියාපදිංචි කරනු ලබයි. මේ ආකාරයට කිහිප වතාවක් ලියාපදිංචි කිරිම සිදු කරනු ලබන අතර සමහර ශිෂ්‍යයන් ලියාපදිංචි නොවීම මත මෙම තත්වය ඇතිව තිබේ. එය ආයතනයේ පාලනයකින් තොර තත්වයකි.

(ආ) පාඨමාලාවේ ඇති සමහර අඩුපාඩු, ආයතනයේ හා ආයුර්වේද ශික්ෂණ රෝහලේ සම්පත් හිඟවීම, සිසුන් ප්‍රායෝගික කටයුතු වලට සහාභාගි විම අඩුවීම හා ශිෂ්‍යන්ගේ බාහිර කටයුතු මෙයට හේතු විය හැක අතර පාඨමාලාවේ අවශ්‍ය සංශෝධන කර ඇති අතර මෙම තත්වය අවම කර ගත හැකි ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් සිටියි.

**2.4.2. කලමණාකරණ අකාර්යක්ෂමතා**

(අ) ඉදිරියේදී ප්‍රමාදයන් අවම කර නියමිත කාලය තුල වත්කම් සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරිමට පියවර ගනු ලැබේ.

(ආ) පරීක්ෂාකර බලා අවශ්‍ය පියවර ගනු ලැබේ.

(ඇ,ඈ) ඇ සහ ඈ සඳහන් කරුණු සම්බන්ධව කලමනාකරණ මණ්ඩලය විසින් පත්කරන ලද කමිටුවක් විසින් මේ සම්බන්ධව විමර්ශණයක් සිදු කරගෙන යනු ලැබේ.

(ඉ) අදාල උපකරණ කාන්තා නේවාසිකාගාරයට ලබා දී මේ වන විට පාවිච්චියට ගනු ලැබේ.

(ඊ) පිලිගනිමි, අදාල පාඨමාලාව සම්බන්ධව නිශ්චිත තීරණයක් ගෙන නොතිබුණි. එබැවින් මෙම තත්වය ඇති වී තිබේ. කෙසේ වෙතත්මේ වන විට සම්පූර්ණ මුදල් රු.850,000ක් ගෙවා තිබු ශිෂ්‍යයා වෙත අදාල මුදල ආපසු ගෙවා ඇත.

**2.4.3 අයිකාරි බලය නොලත් ගණුදෙනු**

එච්.ඩී. ආයුර්වේද පාඨමාලාවේ ආදායමෙන් මෙවැනි අරමුදලක් පවත්වාගෙන යාමට යෝජනා වූ නමුදු පාඨමාලාව නැවැත්වීමත් සමඟ මෙම යෝජනාව අක්‍රිය වී ඇත.

**2.4.4 ප්‍රසම්පාදන කටයුතු**

(අ) **(i)** 2019 වර්ෂයේ සිට 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(ආ) ඡේදයේ ප්‍රකාර ප්‍රසම්පාදන සැලැස්ම පිලියෙල කරනු ලැබේ.

**ii.** 2018 වර්ෂයේ විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මේ සඳහන් කාලවකවානු වැඩවර්ජන හා ශිෂ්‍ය ක්‍රියාමාර්ග වැනි ප්‍රායෝගික තත්වය හමුවේ යම් තරමකට වෙනස් වී ඇත. කෙසේ වෙනත් 2019 වර්ෂයේදී අදාල කාලවකවානු වෙනස් වීම් අවම කර ගැනීමට කටයුතු කරනු ඇත.

**iii.** 2018 වර්ෂයේ ඉටු නොවී පැවති ප්‍රසම්පාදන 2019 වර්ෂයේ පිලියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්මේ අවිනිශ්චිත ලෙස දක්වා ඇත.

(ආ) 2017 වර්ෂයේ ආරම්භ කර වැඩ නිම නොවූ කොන්ත්‍රත් සඳහා 2018 වර්ෂයේ වැඩ අවසන් වීමෙන් අනතුරුව අදාල මුදල් ගෙවා ඇත.

**2.4.5 අරමුදල් උපයෝජනය**

උපයෝජනය නොකරන ලද මුදල වශයෙන් පෙන්වා ඇති මුදල් උපයෝජනය නොවී තිබුනේ ඇනවුම් කරන ලද භාණ්ඩ හා ප්‍රධානය කරන ලද කොන්ත්‍රාත්වලට අදාල බිල්පත් සඳහා ගෙවීම ප්‍රමාදවීම මතය. 2018.12.31 දිනැති විවිධ ණයගැති වටිනාකම රු.12,363,611කි. කෙසේ වෙතත් ඉදිරියේ සියලු මුදල් අදාල වර්ෂය තුල උපයෝජනය කිරිමට කටයුතු කරනු ඇත.

**2.4.6. මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කිරිම**

(අ) 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව පිලියෙල කරමින් පවතින අතර ඉදිරියේදී විගණනය ඉදිරිපත් කිරිමට කටයුතු කරනු ඇත.

**2.4.7 ක්‍රියාකාරි සැලැස්ම**

(අ) නිවැරදිව පිලියෙල කර ඇත.

(ආ) අඩුපාඩු අවම කරගෙන 2019 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම පිලියෙල කර ඇත.

**3. අයවැය පාලනය**

ප්‍රායෝගික තත්වය හමුවේ අයවැය ගත වියදම් හා තත්‍ය වියදම් අතර විචලනයන් ඇතිව තිබේ. කෙසේ වෙතත් විගණනය විසින් පෙන්වා ඇති පරිදි ඉදිරියේදී කටයුතු කරනු ඇත.

**4. තිරසාර සංවර්ධනය**

විගණනය විසින් පෙන්වා ඇති අඩුපාඩු හඳුනාගෙන තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ලඟා විය යුතු සංඛිස්ථාන හා ඉලක්ක මැන බැලීම සඳහා වූ දර්ශකයන් හඳුනා ගැනීමට 2019 වර්ෂයේ දී කටයුතු තරනු ඇත.

**5. පද්ධති පාලනයන්**

විගණනය විසින් පෙන්වා ඇති පද්ධති හා පාලන ක්ෂේත්‍ර පිළිබඳ අවධානය යොමු කර අඩුපාඩු අවම වන සේ කටයුතු කිරීමට උපදෙස් ලබාදෙන ලදී.

ජ්‍යෝෂ්ඨ මහාචාර්ය පී.ඒ. පරණගම
අධ්‍යක්ෂ,
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය.

පිටපත් - සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
උපකුලපති - කොළඹ විශ්වවිද්‍යාලය
ලේකම් - නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
ලේකම් - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

DR/DB/Heads MYn/mm. FMA


# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. } ඊඩීයු/බී/අයිඅයිඑම්/එෆ්ඒ/18

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date } 2019 මැයි 31 දින

RECEIVED
03 JUN 2019
Director's Office
IIM, Rajagiriya

03.06.19

අධ්‍යක්ෂ,

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය,

රාජගිරිය.

**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් :

| | | |
|---|---|---|
| 1. | සභාපති | -විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව |
| 2. | උපකුලපති | -කොළඹ විශ්වවිද්‍යාලය |
| 3. | ලේකම් | -නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය |
| 4. | ලේකම් | - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය |


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

මගේ අංකය / எனது இல. / My No. } ඊඩියු/බී/අයිඅයිඑම්/එෆ්ජ්/2018   ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2019 මැයි 3 දින

අධ්‍යක්ෂ

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය

**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------

### 1.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත

-----------------------------------------

විස්තර පහත පරිදි විය.

(අ) දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යනාංශයට අනුයුක්තව පවත්වාගෙන යමින් තිබූ එම්.ඩී.(ආයුර්වේද) (2016/2019 ) වසර 3 ක පාඨමාලාවෙහි අධ්‍යන කටයුතු සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 ප්‍රකාරව මේ සම්බන්ධයෙන් පැනනැගිය හැකි අසම්භාව්‍ය තත්ත්වයන් සැලකිල්ලට ගෙන මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

(ආ) උපචිත පදනමට ගණනය කිරීමට ආයතනයට පැවති බාධාවන් හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලද රු.395,300 ක් වූ නේවාසිකාගාර ගාස්තු ආදායම මුදල් පදනම මත ගිණුම්ගත කිරීම පිළිබඳව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

### 1.2.2 අනෙකුත් ගිණුම්කරණ අඩුපාඩු

--------------------------------

විස්තර පහත පරිදි විය.

(අ) එම්.ඩී.(ආයුර්වේද) (2016/2019 ) වසර 3 ක පාඨමාලාව සඳහා 2017 වර්ෂය තුළදී රු.3,800,000 ක් වූ ලැබිය යුතු ආදායම් වටිනාකම තුළ සමාලෝචිත වර්ෂය අවසාන වන විට පාඨමාලාව හැරගොස් තිබූ සිසුවකුගෙන් ලැබිය යුතු රු.211,111 ක් ගිණුම්වල ගැලපීම් කර නොතිබුණි.

(ආ) බැහැර දෙන ලද පුස්තකාල පොත් ආපසු ගෙනවිත් භාරදීමට ප්‍රමාදවීම මත රු.10,803 ක දඩ මුදලක් ලැබීමට තිබූ නමුත් ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(i)(ඇ)(III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

**2.1** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

දේශිය වෛද්‍ය විද්‍යා ආයතනයේ ආචාර ධර්ම කමිටුවට 2016 වර්ෂය වනවිට සායනික පර්යේෂණයක් සිදුකිරීම සඳහා අනුමැතිය ලබාදීමට අධිකාරී බලය නොමැති අතර එවැනි අවස්තාවකදී අනුගාමී ආයතනයක ස්ථාපිත කර ඇති සායනික පර්යේෂණයක් සිදු කිරීම සඳහා අනුමැතිය ලබාදිය හැකි ආචාර ධර්ම කමිටුවක අනුමැතිය ලබාගත යුතු වුවද එලෙස සිදු නොකර දේශිය වෛද්‍ය විද්‍යා ආයතනයේ ආචාර ධර්ම කමිටුවේ අනුමැතිය මත ආයුර්වේද ශික්ෂණ

රෝහලෙහි රෝගීන්ට ඖෂධ ලබාදීම මගින් සායනික පරීක්ෂණයක් 2016 දෙසැම්බර් මස දී සිදු කර තිබුණි. මෙම පර්යේෂණය සිදු කරන ලද පර්යේෂකයින් 04 දෙනාගෙන් දෙදෙනෙකු දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ ආචාර ධර්ම කමිටුවේ සභාපති හා ලේකම් තනතුරු දරනු ලබන ලද කාලපරිච්ඡේදය තුළදී ඔවුන් දෙදෙනාද සහාභාගී වූ පර්යේෂණය සඳහා ආචාර ධර්ම කමිටුවේ අනුමැතිය ලබාගෙන තිබූ අතර ඉන් එක් කථිකාචාර්යවරයකු කැස්ස පැණිය ගෙන්වා බෙදාහරින සමාගමේ උපදේශකවරයකුද විය.

**2.2** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීති රීති, රෙගුලාසි හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධිවධානවලට යොමුව | විස්තරය |
|---|---|
| **(අ)** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| **(i)** මුදල් රෙගුලාසි 104 | වත්කම් ප්‍රත්‍යාගණන අවස්ථාවේදී පිරිවැය වටිනාකම රු.744,947 ක් වූ වත්කම්වල පැවැත්ම තහවුරු වී නොමැති බව හෙළිදරව් කරගෙන තිබුණද ආයතනය විසින් ඒ පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| **(ii)** මුදල් රෙගුලාසි 371 | අත්තිකාරම් වශයෙන් ලබාගත් මුදල් අදාළ කාර්යය අවසාන වූ වහාම පියවිය යුතු වුවත් අවස්ථා 10 කදී ලබාදී තිබූ මුළු මුදලම භාවිතා කිරීමකින් තොරව කාල ප්‍රමාදයක් සහිතව නැවත පියවීම්කර තිබුණි. |

| | |
|---|---|
| (ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.2 හා 4.2.6 වගන්ති | යුනානි, ආයුර්වේද හා පශ්චාත් උපාධි අංශවල ආංශික කාර්යසාධනය කළමණාකරණ මණ්ඩලය විසින් ඇගයීමට ලක් කර තිබුණද කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික කාර්යසාධන වාර්තා රේඛීය අමාත්‍යාංශයට සහ භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය 3 වන උපලේඛනය | ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් චක්‍රලේඛනයෙන් අපේක්ෂිත පරිදිම ඒවායේ වාර්තා තබා ගැනීමට සෑම ප්‍රයත්නයක්ම ගත යුතු වුවත් ස්ථාවර වත්කම් ලේඛනයෙහි සමුච්චිත ක්ෂයවීම් දැක්වෙන ආකාරයෙන් ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 3.1.6 ඡේදය | චක්‍රලේඛය ප්‍රකාරව 2018 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2019 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ආයතනයෙහි අංශ 6 කට අදාළව එම වාර්තා 2019 මැයි 10 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

**2.3** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව.

**2.4** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මූල්‍ය අනුග්‍රහය මත පශ්චාත් උපාධි පුහුණුවක් සඳහා විදේශගත වූ කථිකාචාර්යවරයෙකුගේ ගුවන් ටිකට්පත් ගාස්තු ලෙස 2012 වර්ෂයේ දී ආයතනයෙන් ගෙවන ලද රු. 79,000 ක් 2018 වර්ෂය දක්වාම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් අයකරගෙන නොතිබුණි.

(ආ) විදේශීය ප්‍රකාශකයන්ගෙන් ප්‍රකාශන මිලදී ගැනීමේදී සේවාව ලබාගැනීමට පෙර ආයතනය විසින් මුදල් ගෙවීම කරනු ලබන අතර එලෙස ප්‍රකාශන මිලදී ගැනීම සඳහා 2018 දෙසැම්බර් 31 දින වනවිට නිදහස් කර තිබූ මුදල රු.3,937,832 ක් වූ අතර ඒ තුළ වර්ෂ 1 සිට වර්ෂ 5 දක්වා පැරණි ශේෂය රු.1,615,057 ක් විය.

(ඇ) පසුගිය වසර 7 තුළදී ආයතනයේ සිසුන් බඳවාගැනීම පිළිබඳ පරීක්ෂා කිරීමේදී විශ්වවිද්‍යාලයේ පවතින සම්පත් අනුව බඳවාගැනීමට පහසුකම් තිබුණු සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව 1,580 ක් වුවද මෙම කාල පරිච්ඡේදයේදී බඳවාගෙන තිබූ ශිෂ්‍ය සංඛ්‍යාව 1,475 ක් පමණි. එනම් බඳවා ගැනීමට හැකියාව ඇති මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 93.4 කි.

(ඈ) වත්කම් සමීක්ෂණ වාර්තාව අනුව 2018 දෙසැම්බර් 31 දිනට වත්කම් ඒකක 44 ක් බඩු වට්ටෝරු පොතේ ලේඛනගත කර නොතිබූ බව හා වත්කම් ඒකක 96 ක් ඌණව තිබුණි.

(ඉ) පිළිවෙලින් රු.86,130 ක් සහ රු.15,500 ක් වටිනා ශීතකරණයක් සහ මයික්‍රොවේව් අවන් එකක් පොදු පරිහරණය සඳහා 2018 සැප්තැම්බර් 19 වන දින මිලදී ගෙන තිබුණද 2019 ජනවාරි 14 විගණිත දිනය වන විටත් භාවිතා නොකොට නිෂ්කාර්යව පැවතුණි.

(ඊ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1.(ආ) ඡේදය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම අවම වශයෙන් වසර 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු, ප්‍රධාන ප්‍රසම්පාදන සැලසුමෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවද, ආයතනය ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයට අදාළව පිළියෙල කර තිබූ විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මෙහි ආයතනයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ කාල වකවානු දක්වා තිබුණද ආයතනය තුළ සිදු කරනු ලබන ප්‍රසම්පාදන ක්‍රියාවලිය පරීක්ෂා කිරීමේදී සැලැසුම් කරන ලද කාල වකවානු අනුව සිදුකර නොතිබුණි.

(ඌ) පසුගිය වර්ෂයට අදාළ ඉටු නොවී පවතින ප්‍රසම්පාදනයන් ප්‍රසම්පාදන සැලැස්ම තුළ අච්චිච්චන්න වැඩ ලෙස දක්වා නොතිබීම හේතුවෙන් අච්චිච්චන්න තත්ත්වය හා සමාලෝචිත වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රසම්පාදනය තුළින් අපේක්ෂිත ඉලක්ක හා ලගාකර ගත් ප්‍රගතිය විය.

(එ) ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රකාරව මිලදී ගැනීම් සිදු නොකිරීම හේතුවෙන් ලබාදෙන ලද රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන 2018 දෙසැම්බර් 31 දිනට උපයෝජනය නොකරන ලද මුදල රු.7,788,661 ක් විය.

(ඒ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ උපදෙස් පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළට අන්තර්ගත විය යුතු සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය, දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳව, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම, අයවැය ලේඛණය, ප්‍රසම්පාදන සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත් කර නොතිබුණි.

## 2.5 වෙනත් නිරීක්ෂණ

--------------------

විස්තර පහත පරිදි විය.

(අ) අධ්‍යයන වර්ෂ 7 කට අදාල විභාග ප්‍රතිඵල පරීක්ෂා කිරීමේදී විභාග සඳහා පෙනී සිටි සිසුන්ගෙන් විභාග අසමත් වීමේ ප්‍රතිශතය, සිසුන්ගේ ජ්‍යෙෂ්ඨතාවය සමග වර්ධනය වී තිබුණු අතර 2010/2011 සිට 2016/2017 අධ්‍යයන වර්ෂය දක්වා අධ්‍යයන වර්ෂ 7 කට අදාල සිසුන් සඳහා සමාලෝචිත වර්ෂය තුළ නියමිත විභාග වාර 25 ක් පවත්වා තිබූ අතර එම විභාග සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් අසමත් වීමේ ප්‍රතිශතය ආයුර්වේද වෛද්‍ය උපාධිය සහ යුනානි වෛද්‍ය උපාධිය සඳහා පිළිවෙලින් සියයට 44 ක් සහ 35 ක් විය.

(ආ) ආයුර්වේද හා යුනානි පාඨමාලාවල පසුගිය අධ්‍යයන වර්ෂ 6 ට අදාළ සිසුන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විට පිළිවෙලින් සිසුන් 94 ක් හා සිසුන් 39 ක් පාඨමාලාව හැරගොස් තිබුණි. මෙය පසුගිය වසරට සාපේක්ෂව පිළිවෙලින් සියයට 14 ක් හා සියයට 15 ක අයහපත් වර්ධනයක් විය.

(ඇ) ප්‍රාග්ධන වත්කම් පුනරුත්තාපනය සහ වැඩිදියුණු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති 09 ක් වෙනුවෙන් රු. 16,910,425 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර ප්‍රාග්ධන වත්කම පුනරුත්තාපනය සහ වැඩිදියුණු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ රු.15,208,945 ක් වැය කර තිබුණි. එම වියදමින් රු.9,471,101 ක් 2017 වර්ෂයට අදාළ ව්‍යාපෘති සඳහා වැය කර තිබුණි.

(ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සමග කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2018 වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කිරීමේදී ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් ආයතනයේ ඉලක්ක හා අරමුණු ළඟාවීම් මැන බැලීමට නොහැකි විය.

(ඊ) තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" පිළිබඳව ආයතනය විසින් දැනුවත් වී තිබුණ නමුත් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සංධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති